# වාර්ෂික වාර්තාව

# 2013

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,**

**නුගේගොඩ.**

## පටුන


- සභාපතිතුමාගේ සමාලෝචනය හා වාර්තාව ගරු ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම- ——— 01
- ආයතනයේ දර්ශනය හා මෙහෙවර ප්‍රකාශය- ——— 02
- අධ්‍යක්ෂ මණ්ඩලය- ——— 03
- ආයතනයේ සංවිධාන ව්‍යුහය- ——— 04
- පෙරවදන- ——— 05

**අංශභාර අධ්‍යක්ෂතුමන්ලාගේ වාර්තා**

- මෙහෙයුම් අංශය- ——— 07
- රක්ෂණ අංශය- ——— 12
  - ❖ කෘෂිකාර්මික රක්ෂණ කටයුතු සහ පශු සම්පත් රක්ෂණ කටයුතු
- ගොවි විශ්‍රාම වැටුප් අංශය- ——— 14
  - ❖ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- පරිපාලන හා මානව සම්පත් අංශය- ——— 21
- අභ්‍යන්තර විගණන අංශය- ——— 26
- මුදල් අංශය ——— 29

**ගිණුම්**

- සමස්ත යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන- ——— 34
- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ——— 37
- ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ——— 63
- ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ——— 82

**විගණකාධිපති වාර්තා**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ——— 99
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ——— 109
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ——— 119

**විගණකාධිපති වාර්තා සඳහා පිළිතුරු**

- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය- ——— 127
- ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ——— 139
- ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය- ——— 144

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Rakshana
117-සුභද්‍රාරාම පාර,ගංගොඩවිල,නුගේගොඩ
117-Subadrarama road,Gangodawila
Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 3/1/13 ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ............

දිනය / திகதி / Date } 2015/12/07

ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය"
80/5, රජමල්වත්ත පටුමග
බත්තරමුල්ල.

ලේකම්තුමනි,

<u>වාර්ෂික වාර්තාව 2013</u>

දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීම උදෙසා 70 දශකයේ ආරම්භයේ සිට රජය මඟින් ක්‍රියාත්මක කරන ලද වගා සංග්‍රාම වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ආයතන විසින් ලබා දෙන ලද කෘෂිකාර්මික ණය වල සුරක්ෂිතභාවය තහවුරු කිරීමත්, කෘෂිකර්මාන්තය විශ්වාසනීය වෘත්තියක් බවට පත් කිරීමත් අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට විධිමත් අවදානම් කළමණාකරන ක්‍රමවේදයක් වශයෙන් කෘෂිකාර්මික රක්ෂණය හඳුන්වා දීම සඳහා 1973 අංක 27 දරණ කෘෂිකාර්මික රක්ෂණ පනත මඟින් පිහිටවනු ලැබූ කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය 2013 වර්ෂයේදී සිය සේවාවන්හි 40 වන වසර සපුරන ලදී. ඒ අනුව 2013 වසර මණ්ඩලීය ඉතිහාසයේ සුවිශේෂී වසරක් වශයෙන් හැඳින්විය හැක.

මෙම මණ්ඩලය පිහිටුවීමේ මූලික අරමුණ වූ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීම උදෙසා මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටු කරනු වස් කෘෂිකාර්මික රක්ෂණයට ප්‍රමුඛත්වය ලබා දෙමින් රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් 2013 වර්ෂය තුළදීද දිප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර ඇති අතර, ඒ මඟින් 2013 වර්ෂයේ දී මණ්ඩලය උපයා ගෙන ඇති රක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 93.32 කි

2013 වසර තුල මණ්ඩලයේ පරිපාලන, මෙහෙයුම් හා මූල්‍ය කටයුතු ක්‍රියාත්මක වූ ආකාරය ඇතුලත් කරුණු සහ වර්ෂය තුල සිදුකරන ලද සියලුම ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

පී සිඩ්නි කුමාර ලෝරන්ස් ගජනායක
සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

| | සභාපති / தலைவர் / Chairman | සාමාන්‍යාධිකාරී / பொது முகாமையாளர் / General Manager | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் / Head Office |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | 448693 / 448694 | 438607 | 448691-2 / 438606 / 430058 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 449316 | 438607 | |

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

# දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම

# මෙහෙවර

කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමුහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකි විශිෂ්ඨ සේවාවක් සැපයීම

## අධ්‍යක්ෂ මණ්ඩලය - 2013

| | |
|---|---|
| පී.ඒ. අබේසේකර මහතා<br>නියෝජ්‍ය ලේකම්<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01 | සභාපති (2013.02.26 දක්වා) |
| ආචාර්ය දමිතා ද සොයිසා මිය<br>ලේකම්,<br>ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | සභාපති (2013.03.09 සිට) |
| 1- දමිතා රත්නායක මහත්මිය<br>අධ්‍යක්ෂ<br>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01 | සාමාජික |
| 2- එම්. ඒ. එස්. වීරසිංහ මහතා<br>ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br>කොළඹ 07 | සාමාජික |
| 3- ටී.එච්.සී.එස්. පෙරේරා මහතා<br>අධ්‍යක්ෂ - සමාජ හා ආර්ථික සැලසුම්<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>පේරාදෙණිය | සාමාජික |
| 4- වෛද්‍ය බී. සිවයෝගනාදන් මහතා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>පේරාදෙනිය. | සාමාජික |
| 5- ඒ. ලක්කතාස් මහතා<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය<br>කොළඹ 10 | සාමාජික |
| 6- ඩබ්. ඒ. සී. තිසේරා මහතා<br>සහකාර සාමාන්‍යාධිකාරී<br>ලංකා බැංකුව | සාමාජික |
| 7- ආචාර්ය ඩී.එම්.එන්. දිසානායක මහතා<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>බත්තරමුල්ල. | සාමාජික |

# කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
# ආයතනික ව්‍යුහය



# පෙරවදන

දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීම උදෙසා 70 දශකයේ ආරම්භයේ සිට රජය මඟින් ක්‍රියාත්මක කරන ලද වගා සංග්‍රාම වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ආයතන විසින් ලබා දෙන ලද කෘෂිකාර්මික ණය වල සුරක්ෂිතභාවය තහවුරු කිරීමත්, කෘෂිකර්මාන්තය විශ්වාසනීය වෘත්තියක් බවට පත් කිරීමත් අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට විධිමත් අවදානම් කළමණාකරන ක්‍රමවේදයක් වශයෙන් කෘෂිකාර්මික රක්ෂණය හඳුන්වා දීම සඳහා 1973 අංක 27 දරණ කෘෂිකාර්මික රක්ෂණ පනත මඟින් පිහිටවනු ලැබූ කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය 2013 වර්ෂයේදී සිය සේවාවන්හි 40 වන වසර සපුරන ලදී. ඒ අනුව 2013 වසර මණ්ඩලීය ඉතිහාසයේ සුවිශේෂී වසරක් වශයෙන් හැඳින්විය හැක.

මෙම මණ්ඩලය පිහිටුවීමේ මූලික අරමුණ වූ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීම උදෙසා මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටු කරනු වස් කෘෂිකාර්මික රක්ෂණයට ප්‍රමුඛත්වය ලබා දෙමින් රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් 2013 වර්ෂය තුළදීද දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර ඇති අතර, ඒ මඟින් 2013 වර්ෂයේ දී මණ්ඩලය උපයා ගෙන ඇති රක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 93.32 කි

**වාරික අදායම 2007 සිට 2013 දක්වා**

| යෝජනා ක්‍රමය | 2007 (රු.මිලි) | 2008 (රු.මිලි) | 2009 (රු.මිලි) | 2010 (රු.මිලි) | 2011 (රු.මිලි) | 2012 (රු.මිලි) | 2013 (රු.මිලි) |
|---|---|---|---|---|---|---|---|
| වගා රක්ෂණය | 12.08 | 47.41 | 55.35 | 79.69 | 119.07 | 99.9 | 82.16 |
| පශු සම්පත් රක්ෂණය | 8.76 | 14.24 | 14.52 | 12.77 | 18.24 | 15.8 | 8.89 |
| ගබඩා හා කෘෂි උපකරණ රක්ෂණය | - | 0.96 | 1.54 | 3.4 | 5.93 | 6.5 | 1.53 |
| සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය | 7.41 | 7.88 | 9.01 | 9.62 | 14.23 | 2.5 | 0.74 |
| **එකතුව** | **28.25** | **70.49** | **80.42** | **105.48** | **157.47** | **124.7** | **93.32** |

පසුගිය වසර කිහිපය තුළදීම දිවයිනේ බොහෝ ප්‍රදේශ වලට වරින් වර බලපෑ අධික ගංවතුර හා දැඩි නියං තත්වයන් මත විශාල වශයෙන් වගාවන්ට හානි සිදුවීම හේතුවෙන් ගොවීන් හට මූල්‍ය ආයතන වලින් ලබා ගත් කෘෂිකාර්මික ණය ගෙවා ගැනීමට නොහැකි වීම නිසා එම මූල්‍ය ආයතන විසින් කෘෂිකාර්මික ණය නිකුත් කිරීම සීමා කිරීමත්, ඊට අමතරව 2013 යල සහ මහ කන්න ආරම්භයේදී දිවයිනේ ප්‍රධානතම කෘෂිකාර්මික දිස්ත්‍රික්ක වලට බලපෑ අධික නියං තත්වය මත ප්‍රමාණවත් ජල පහසුකම් නොලැබීම නිසා බොහෝ ඉඩම් වගා නොකිරීමත් 2013 වර්ෂයේදී වගා රක්ෂණ කටයුතු වලින් අපේක්ෂිත ආදායම ලබා ගැනීමට බාධක විය. එම තත්වය 2013 වර්ෂයේ සමස්ථ මූල්‍ය ආදායම් වර්ධනය කෙරෙහිද අහිතකර ලෙස බලපෑම් සිදු කර ඇත.

2012/13 මහ කන්නයේදී හා 2013 යල කන්නයේදී රක්ෂිත වගාවන්ට විශාල වශයෙන් ගංවතුරෙන් හානි සිදු වූ අතර, එහිදී හානි වාර්තා වූ අක්කර 18,783 ක් සඳහා රුපියල් මිලියන 143.2 ක වන්දි මුදලක් ගෙවීමට මණ්ඩලයට සිදු විය. එහිදී වගා හානියට පත් ගොවින්ගේ ආර්ථිකය ස්ථායි කිරීම සඳහා මණ්ඩලීය කාර්යභාරය හා වගකීම මැනවින් ඉටු කෙරුණද එම තත්වය මණ්ඩලයේ රක්ෂණ අරමුදල තවදුරටත් හීන විමටද හේතු සාධක වී ඇත.

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමයට බාහිර රක්ෂණ ආයතන වලින් එල්ල වූ තරඟකාරී වෙළෙඳ පොළ තත්වය සැලකිල්ලට ගෙන එම යෝජනා ක්‍රමයේ වාරික අනුපාත හා ක්‍රියාත්මක අතිරික්තය සංශෝධනය කිරීමටද 2013 වර්ෂයේදී කටයුතු කරන ලදී. ඒ අනුව 2013/08/01 දින සිට දීප ව්‍යාප්තව ක්‍රියාත්මකව කරන ලද පශු රක්ෂණ විශේෂ අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන යටතේ වෙළෙඳ පොළ ස්ථාවර කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර, ඒ තුළින් ඉදිරි කාලය තුළ පශු රක්ෂණ වාරික ආදායම වර්ධනය කර ගැනීමට ද අපේක්ෂා කර ඇත. 2013 වර්ෂයේදී පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගෙවා ඇති මුළු වන්දි මුදල් ප්‍රමාණය රු. 682,1637/= කි.

මීට අමතරව බඩ ඉරිඟු, අතිරේක භෝග, අපනයන භෝග, ගබඩා, ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ ඇතුළු රක්ෂණ යෝජනා ක්‍රමද අදාල දිස්ත්‍රික්ක වල ව්‍යාප්ත කිරීම සඳහා 2013 වර්ෂයේ දී කටයුතු කර ඇත.ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල ශූන්‍ය වීම නිසා 2012 වර්ෂයේ සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටුවීමට සිදුවීමෙන් ජනතාවගේ මෙන්ම බාහිර ආයතන වල නිලධාරීන්ගේ ද මණ්ඩලය කෙරෙහි තිබූ විශ්වාසය බිඳී යාම නිසා, ඔවුන්ගේ සෘජු සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන සුවසෙත, හදිසි අනතුරු සහ බොහොමයක් සාමාන්‍ය රක්ෂණ කටයුතු වල පසුබෑමක් 2013 වර්ෂයේදී සිදු වී ඇත. එම තත්වය යටතේ 2013 නොවැම්බර් මාසයේදී අතිගරු ජනාධිපති තුමා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද 2014 අයවැය යෝජනා මඟින් 2014 ජනවාරි මාසයේ සිට ගොවි විශ්‍රාම වැටුප් නැවත ගෙවීම සඳහා රුපියල් මිලියන 1,000 ක මුදලක් වෙන් කරන ලද අතර, එය 2013 වර්ෂයේදී මණ්ඩලය ලද සුවිශේෂී ජයග්‍රහණයක් වශයෙන් සඳහන් කළ හැක.

එම තත්වය උදාකර ගැනීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද සහයෝගය හා මඟ පෙන්වීම මෙම අවස්ථාවේදී බෙහෙවින් අගය කළ යුතුව ඇත.

2013 වර්ෂයේදීද මණ්ඩලයට නිලධාරීන් බඳවා ගැනීමක් සිදු කර නොමැත. නියමිත සැලැස්මට අනුව අනුමත කාර්ය මණ්ඩලය 421 ක් වුවද මේ වන විට සමස්ථ සේවක පිරිස 295 ක් පමණි. ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 126 කි.

මේ අනුව දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටු කරමින් 2013 වර්ෂයේදී මණ්ඩලය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්හි සඵලතා, මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබයි.

fufyhqï wxYh

# <u>මෙහෙයුම් අංශය</u>

දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීම සඳහා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ කෘෂිකාර්මික ව්‍යාපෘති වලට සමගාමීව රාජ්‍ය හා පෞද්ගලික මූල්‍ය ආයතන මඟින් ලබා දෙන ලද කෘෂිකාර්මික ණය වල සුරක්ෂිතභාවය තහවුරු කරලීම සඳහා සහ කෘෂිකර්මාන්තය විශ්වාසනීය වෘත්තියක් බවට පත් කරලීම උදෙසා දේශීය කෘෂි රක්ෂණයේ පුරෝගාමී රාජ්‍ය ආයතනය වශයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම ඉටු කරනු වස් 2013 වසරේදීද මණ්ඩලීය රක්ෂණ යෝජනා ක්‍රම දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශය විසින් කටයුතු කර ඇත.

මෙම රක්ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීමේදී කෘෂිකාර්මික ව්‍යාප්තියට අනුව දිවයිනේ ප්‍රදේශ ප්‍රධාන කෘෂිකාර්මික කලාප හා අර්ධ කෘෂිකාර්මික කලාප වශයෙන් වෙන් වෙන්ව ගෙන රක්ෂණ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කෙරුණි. මෙහිදී අපනයනය අරමුණු කර ගනිමින් ප්‍රධාන කෘෂිකාර්මික කලාප වල සිදු කෙරෙන වී, බඩඉරිඟු, අතිරේක භෝග ඇතුළු වගාවන් සහ ට්‍රැක්ටර් ඇතුළු කෘෂිකාර්මික උපකරණ සඳහා රක්ෂණ ආවරණය ලබා දීම තුළින් වැඩි වාරික ආදායමක් 2013 වර්ෂයේදීද උපයා ගැනීමට හැකියාව ලැබී ඇත. අර්ධ කෘෂිකාර්මික කලාප වලට අයත් ප්‍රදේශ වල ප්‍රධාන වශයෙන්ම පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය සහ ඊට අමතරව හදිසි අනතුරු හා සුවසෙත රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක වී ඇත.

වර්ෂය ආරම්භයේදී දිස්ත්‍රික් කාර්යාල විසින් ඉදිරිපත් කර ඇති වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට අනුව එක් එක් දිස්ත්‍රික්කයේ රක්ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීම තුළින් වාර්ෂික මූල්‍ය ඉලක්කය සපුරා ගැනීමේ ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීමට සහ ඒ අනුව මූල්‍ය ආදායම වර්ධනය කර ගැනීම සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ ඇතුළු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය දැනුවත් කිරීමට හා මෙහෙය වීමට ද මෙහෙයුම් අංශය විසින් කටයුතු කරන ලදී.

මෙම මෙහෙයුම් කටයුතු වලදී දිස්ත්‍රික් කාර්යාල විසින් සහ සෘජුවම ප්‍රධාන කාර්යාලය මඟින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා අවශ්‍ය නිලධාරීන් යෙදවීම, දිස්ත්‍රික් කාර්යාලය සඳහා අමතර ඉන්ධන, යැපීම් දීමනා, ගමන් වියදම් ලබා දීම, ප්‍රචාරක පත්‍රිකා සහ ලිපි ද්‍රව්‍ය ලබා දීම, ප්‍රචාරක සහ ජංගම සේවා වැඩ සටහන් සම්බන්ධීකරණය සහ ඒවා සඳහා බැනර්, කටවුට්, විස්තර පත්‍රිකා ඇතුළු අවශ්‍යතා සපුරාලීම ඇතුළුව එක් එක් රක්ෂණ යෝජනා ක්‍රම සහ සම්බන්ධ බාහිර ආයතන සම්බන්ධීකරණය මඟින් එම ආයතන වල සහයෝගය ලබා දීමද මෙම අංශය මඟින් ඉටු කෙරුණු කාර්යයන් වශයෙන් සඳහන් කළ හැක.

විශේෂයෙන්ම රාජ්‍ය බැංකු සමඟ පවතින අවබෝධතා ගිවිසුම යාවත්කාලීන පවත්වා ගෙන යාමටද කටයුතු කර ඇති අතර, ඒ අනුව 2013 වර්ෂයේදීද වාර්ෂික මූල්‍ය ආදායමින් වැඩි ප්‍රතිශතයක් කෘෂිකාර්මික ණය යටතේ ක්‍රියාත්මක කරන ලද වගා රක්ෂණ යෝජනා ක්‍රම මඟින් උපයා ගැනීමට හැකියාව ලැබී ඇත.

එසේ වුවද, 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී රක්ෂණ වාරික මුදල් ආදායම යම් කිසි පසු බෑමකට ලක් වී ඇති අතර, ඒ සඳහා විවිධ වූ හේතු සාධක බලපා ඇත. විශේෂයෙන්ම පසුගිය වසර කීපය තුළදීම ගංවතුර හා දැඩි නියඟය නිසා වගාවන්ට හානි සිදුවීම හේතුවෙන් වගා ණය ආපසු අය වීම අඩු වීම නිසා මූල්‍ය ආයතන විසින් කෘෂිකාර්මික ණය නිකුත් කිරීම සීමා කිරීමත්, වගා කන්න ආරම්භයේදී ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීම නිසා බොහෝ ප්‍රදේශ වල වගා කටයුතු අත්හිටු වීමට සිදු වීමත් නිසා දිවයිනේ ප්‍රධාන කෘෂිකාර්මික කලාප වලින් වගා රක්ෂණ වාරික මුදල් අයවීම අඩුවීම වාර්ෂික ආදායම් වර්ධනයට අහිතකර බලපෑම් සිදු කර ඇත. එමෙන්ම සෘජුවම

ගොවිජනතාවගේ සහභාගිත්වයෙන් සහ බාහිර ආයතන වල නිලධාරීන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරෙන සුවසෙත සහ හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රම මඟින් අර්ධ කෘෂිකාර්මික කලාප වලින් උපයා ගැනීමට අපේක්ෂා කළ ආදායමද මෙම වර්ෂයේදී අහිමි වී ඇත.

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම 2011 වර්ෂයේ සිට අත්හිටුවීම හේතුවෙන් ගොවි ජනතාවගේ හා බාහිර ආයතන වල නිලධාරීන්ගේ විශ්වාසය බිඳී යාම නිසා ඔවුන්ගේ සහයෝගය නොලැබීම එම තත්වය උදා වීමට ප්‍රධාන වශයෙන් හේතු සාධක වී ඇත. ඊට අමතරව උතුරු නැගෙනහිර ප්‍රදේශ වල දැඩි ලෙස පවතින සහ අනෙකුත් බොහෝ දිස්ත්‍රික්ක වලද පොදුවේ පවතින ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයේ හිඟයද රක්ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්ත කිරීමේදී අහිතකර ලෙස බලපා ඇත.

2012/13 මහ කන්නයේදී දිවයිනේ ප්‍රධාන කෘෂිකාර්මික කලාප වලට බලපෑ අධික ගංවතුර හේතුවෙන් වගාවන්ට සිදු වූ හානි තක්සේරු කිරීම සඳහා එම දිස්ත්‍රික්ක වලට අනුයුක්ත ක්ෂේත්‍ර කාර්යය මණ්ඩල වලට අමතර බාහිර දිස්ත්‍රික්ක වලින්ද නිලධාරීන් යොදවා ඉතා කෙටි කාලයක් තුළ වන්දි ගණනය කිරීම සඳහා යොමු කිරීමටද මෙහෙයුම් අංශය විසින් කටයුතු සංවිධානය කරන ලදී.

පසුගිය වසර කිහිපය තුළදීම අඛණ්ඩව පැවති දේශගුණික හා කාලගුණික විපර්යාසයන් හේතුවෙන් සිදු වූ වගා හානි වෙනුවෙන් විශාල වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවීමට මණ්ඩලයට සිදු වූ අතර, 2012/13 මහ කන්නයේ වගා හානි වෙනුවෙන් පමණක් රු. මිලියන 139 ක වන්දි මුදලක් ගෙවා ඇත. මෙම තත්වය මත මණ්ඩලීය රක්ෂණ අරමුදල හීන වීමේ අභියෝගයකට මුහුණ පෑමකට සිදු වී ඇති අතර, ඒ අනුව, වගා රක්ෂණ ආවරණ ලබා දීමේදී යම් සීමා කිරීම් සිදු කිරීමටද සිදු විය. ඒ අනුව 2013 යල කන්නයේ ගෙවූ වන්දි මුදල රු. මිලියන 4.2 කට සීමා කර ගැනීමට හැකි වී ඇත.

<u>අලෙවි කරණ සහ ප්‍රචාරක කටයුතු</u>

1. රාජ්‍ය බැංකු සමඟ පවත්වාගෙන යනු ලබන අවබෝධතා ගිවිසුමට අනුව කෘෂිකාර්මික ණය යටතේ වගා රක්ෂණ කටයුතු තව දුරටත් පුළුල් කිරීම සඳහා ලංකා බැංකුවේ නිෂ්පාදන හා සංවර්ධන බැංකු කටයුතු පිළිබඳ අතිරේක සාමාන්‍යාධිකාරී සමඟ සහ මහජන බැංකුවේ සමූපකාර සහ සංවර්ධන බැංකු කටයුතු පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සමඟ විශේෂ සාකච්ඡාවක් පවත්වා වගා ණය යටතේ රක්ෂණ කටයුතු මෙම මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කරන ලෙස එම නිලධාරීන් මඟින් සියළුම ප්‍රාදේශීය කළමණාකාරවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

2. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ගැමි දිරිය ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ සහ පොල් වගා කිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීතුමිය සමඟ සාකච්ඡා කර, එම ආයතන යටතේ ක්‍රියාත්මක වන පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති මඟින් ලබා දෙන ගවයින් රක්ෂණය කිරීම සඳහා අදාල ආයතන වල නිලධාරීන්ගේ සහය ලබා ගැනීම.

3. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සේවාගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවි නියෝජිතයින් දැනුවත් කිරීම සඳහා 2013/02/12 දින පැවති වැඩසටහනේදී වගා රක්ෂණය ප්‍රමුඛව මණ්ඩලීය යෝජනා ක්‍රම පිළිබඳව පොළොන්නරුව සහකාර අධ්‍යක්ෂ මඟින් සහභාගි වූ ගොවි නියෝජිතයින්ගේ දැනුවත් කිරීමට සහ එදින දිවා ආහාරය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීමට කටයුතු කර ඇත.

4. “දිවි නැඟුමයි - ගොවි සවියයි” වැඩසටහන යටතේ බ්‍රවුන්ස් සමාගම හා එක්ව කෑගල්ල දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක කරන ලද ට්‍රැක්ටර් රක්‍ෂණ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ රැස්වීම් වලදී භාවිතය සඳහා ඩිජිටල් බැනර් 05 ක් මුද්‍රණය කර ගැනීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී.

5. වගා ණය යටතේ පවත්වා ගෙන යනු ලබන රක්‍ෂණ කටයුතු තව දුරටත් පුළුල් කිරීම සඳහා මහජන බැංකුවේ නිලධාරීන්ගේ සහයෝගය ලබා ගැනීම අරමුණු කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ සුහද ක්‍රිකට් තරඟයක් 2013/05/18 දින මහියංගනයේදී පැවැත්විණි.

6. 2013/08/01 දින සිට දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරෙන පශු සම්පත් රක්‍ෂණ ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් හමුවී සාකච්ඡා කර සියළුම පශු වෛද්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඒ සඳහා ලබා ගැනීම.

7. ඉහත වැඩසටහනට අදාලව සිංහල හා දෙමළ භාෂා වලින් මුද්‍රිත අත් පත්‍රිකා සියළු දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දීම.

8. 2013/11/02 දින මහනුවරදී සහ 2013/11/09 දින කුරුණෑගලදී පැවති එම දිස්ත්‍රික්ක වල සත්ත්ව සංවර්ධන උපදේශකවරුන්ගේ වාර්ෂික රැස්වීම් සඳහා අනුග්‍රහය දැක්වීම සහ පශු රක්‍ෂණ ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳව එම නිලධාරීන් දැනුවත් කර එම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සහය ලබා ගැනීම .

9. මණ්ඩලය පිහිටුවා වසර 40 ක් සපිරීම නිමිති කොට ගෙන රජයටත්, මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට හා සමස්ථ ගොවි ජනතාව ප්‍රමුඛ ශ්‍රී ලංකා වාසී ජනතාවටත් සෙත් පතා පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය විසින් සංවිධානය කර 2013/07/18 දින එම කාර්යාලයේදී පැවති සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනාවට අධ්‍යක්‍ෂ ජනරාල් තුමා ඇතුළු නිලධාරීන්ගේ සහභාගීත්වය හා අනුග්‍රහය ලබා දීම.

10. අපනයන බෝග වගා රක්‍ෂණ කටයුතු විධිමත් කර ගැනීම සඳහා සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් තුමා ඇතුළු කාර්යය මණ්ඩලය හා කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ අධ්‍යක්‍ෂ ජනරාල් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් විශේෂ සාකච්ඡාවක් සංවිධානය කර 2013/08/13 දින එම අමාත්‍යාංශයේදී පවත්වන ලදී.

11. අපනයන භෝග වගා රක්‍ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ අත් පත්‍රිකා 2500 ක් මුද්‍රණය කර ප්‍රවර්ධන වැඩසටහන් වලදී භාවිතය සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දී ඇත.

12. දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සංවිධානය කර 2013 දෙසැම්බර් මස 03,04,05, දින වලදී කැකනදුර සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන භූමියේදී පවත්වන ලද ප්‍රදර්ශනයේදී මාතර දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්‍ෂ මඟින් ප්‍රදර්ශන කුටියක් පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදී.

13. මහජන සම්බන්ධතා හා මහජන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් 2013 සැප්තැම්බර් මස 07,08,14 දින වලදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේදීද, 2013 සැප්තැම්බර් මස 28,29 දින වලදී බදුල්ල දිස්ත්‍රික්කයේදීද පවත්වන ලද ''ජන සෙතට ජන හවුල'' ප්‍රජා සත්කාර ජංගම සේවා වැඩසටහන් වලදී මණ්ඩලීය ජංගම කුටියක් පවත්වා ගෙන යාම සහ ඒ සඳහා අවශ්‍ය අත් පත්‍රිකා , බැනර්, කටවුට්, සැපයීම.

14. ''එක්ව රැකෙමු - සැම සුරැකෙමු'' තේමාව යටතේ කාර්ය මණ්ඩයේ ආකල්පමය වෙනසක් සිදු කිරීම තුළින් සාර්ථකත්වයට ලඟා වීම සඳහා සේවකයින්ගේ අභිප්‍රේරණයන් වැඩි දියුණු කරලීමේ අරමුණෙන් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල සමස්ථ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් විශේෂ සම්මන්ත්‍රණයක් 2013/08/17 දින කෘෂිකර්ම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

15. ප්‍රධාන කාර්යාලයේ එක් එක් අංශය වෙත පැවරී ඇති කාර්ය භාරය හා එම කාර්යයන් ඉටු කිරීමේදී අනෙකුත් අංශ වලින් ලැබිය යුතු සහයෝගය පිළිබඳව ප්‍රධාන කාර්යාලයේ සමස්ථ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ දේශණ මාලාවක් අංශ ප්‍රධානීන් මඟින් 2013 සැප්තැම්බර් මස 02 සිට 06 දින දක්වා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.

16. මණ්ඩලයේ ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී රියදුරු හා කාර්යාල සහයක කාර්යය මණ්ඩලයේ දායකත්වය පිළිබඳව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් 2013/10/05 දින ප්‍රධාන කාර්යාලයේ හා සියළුම දිස්ත්‍රික් කාර්යාල වල රියදුරු හා කාර්යාල සහයක කාර්යය මණ්ඩලයේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

17. 2013/10/11 දින පැවති මණ්ඩලයේ විධායක නිලධාරී රැස්වීමේදී නිලධාරීන්ගේ කාර්ය සඵලතාවයන් වර්ධනය කර ගැනීම උදෙසා ''නායකත්ව ගුණාංග වර්ධනය හා ඵලදායිතා වර්ධනය'' මැයෙන් විශේෂ දේශණයක් ශ්‍රී ලංකා ඵලදායිතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂතුමිය විසින් පවත්වන ලදී.

18. මණ්ඩලීය රක්ෂණ යෝජනා ක්‍රම වලට අදාලව ප්‍රතිලාභ ගෙවීමේදී ඒ පිළිබඳව ජනතාව දැනුවත් වන පරිදි දේශපාලන අධිකාරියේ සහ රාජ්‍ය හා බැංකු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ප්‍රචාරාත්මකව උත්සව දිස්ත්‍රික් මට්ටමින් පවත්වා ඇති අතර, ඒ පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත ජන මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා දීමටද කටයුතු කර ඇත.

# රක්ෂණ අංශය

## කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය

## හා

## පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය

## <u>රක්ෂණ අංශය</u>

**වන්දි ගෙවීමේ කටයුතු**

2012/13 මහ කන්නයේදී ඇතිවූ අධික ගංවතුර තත්වය යටතේ රක්ෂිත වගාව විශාල වශයෙන් හානි විය.එම තත්වය හමුවේ ඉදිරිපත් වූ වන්දි ලේඛන සංඛ්‍යාව 6698 කි.හානි වූ අක්කර ප්‍රමාණය 18149 කි.මෙම හානි වූ වගාවන් සඳහා වන්දි ගණනය කර වන්දි මුදල් නිදහස් කරන ලදී.ගෙවූ මුළු වන්දි මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 139 කි.

2013 යල කන්නයේදී ද රක්ෂිත වගාව ගංවතුර තත්වය යටතේ හානි විය.හානි වූ අක්කර ප්‍රමාණය 634කි.ගෙවූ වන්දි මුදල මිලියන 4.2 කි.

ඉහත කන්න දෙකේදීම සති දෙකක් වැනි කාලසීමාවක් තුලදී වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

**පශු රක්ෂණ වන්දි ගෙවීම**

2013 වර්ෂයේදී සතුන් 251ක් සඳහා ගෙවන ලද වන්දි ප්‍රමාණය 6,821,637 කි.

**ප්‍රාරක්ෂණ කටයුතු**

1 - යාපනය දිස්ත්‍රික්කය සඳහා හඳුන්වා දී ඇති වී හා අර්තාපල් නව ප්‍රභේදයන් සඳහා රක්ෂණ ආවරණ දීර්ඝ කර යෝජනා ක්‍රම පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

2 - පශු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2013/08/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.මේ යටතේ පවතින තරගකාරි වෙළඳපල තත්වය සැලකිල්ලට ගෙන වාරික අනුපාත හා ක්‍රියාත්මක අතිරික්තය සංශෝධනය කර මාස 6 කාලයක් සඳහා මෙම අලෙවි ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ තුළින් ගිලිහී ගිය වෙළඳපල රැක ගැනිමට හැකිවිය. ඒ අනුව වෙළඳපල තවදුරටත් ස්ථාවරව රැකගැනීම සඳහා මෙම වැඩසටහන ඉදිරි මාස 6 සඳහා ද ක්‍රියාත්මක කරන ලදී.

3 - වගා හානි වන්දි ගෙවීමේ වැඩසටහන් වලදී වන්දි ලාභීන්ට සාමාන්‍ය රක්ෂණ කටයුතු , සුවසෙත, හදිසි අනතුරු රක්ෂණ කටයුතු සඳහාද දායක කිරීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් කාර්යාල වලට උපදෙස් දෙන ලදී.

4 - 2013 වර්ෂයේදී පවත්වන ලද කාර්යමණ්ඩලය දැනුවත් කිරිමේ වැඩසටහන් සඳහා සවිමත් දායකත්වයක් සපයමින් ඍජු ලෙස දායක වීම හා කාර්ය මණ්ඩලය එම වැඩසටහන් වලට යොමු කිරීමටද කටයුතු කරන ලදී.

5 - 2013 දෙසැම්බර් මාසයේදී ඉහල කළමණාකාරීත්වයේ උපදෙස් පරිදි අංශයේ සියළුම කාර්ය මණ්ඩලය ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමේ විශේෂ රාජකාරි සඳහා යොදවන ලදී.ඒ තුලින් එම විෂයට අදාල කාර්යයන් කාර්යක්ෂමව කර ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කර ගැනීමට අංශයේ දායකත්වය ලබා දෙන ලදී.

# ගොවි විශ්‍රාම වැටුප් අංශය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## හා

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය.

➢ **ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

1987 අංක 12 දරණ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මඟින් ආරම්භ කරන ලද ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට 2013 වර්ෂය වන විට දායක වී ඇති මුළු දායකයින් සංඛ්‍යාව 959254 කි.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත මඟින් සලසා ඇති ප්‍රතිපාදන අනුව වැඩි වයස් කාණ්ඩවලට වයස අවුරුදු 60 සම්පූර්ණකල පසු ලැබිය යුතු විශ්‍රාම වැටුප රු:200/= ක් වුවද මේ සම්බන්ධයෙන් අවස්ථා 02ක දී ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ලැබිය යුතු විශ්‍රාම වැටුප රු:1000/= දක්වා වැඩි කිරීම, විශ්‍රාමිකයා මියගිය දින සිට විශ්‍රාමිකයා ජීවත්ව සිටියේ නම් විශ්‍රාමිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප් ගෙවීම, වයස අවුරුදු 46 සිට 59 දක්වා වූ වයස් කාණ්ඩවලට අයත් පුද්ගලයින්ට මෙම යෝජනා ක්‍රමයට දායක වීමට පනත මඟින් සලසා තිබූ අවුරුදු 02 ක කාල සීමාව 2007 වර්ෂය දක්වා දීර්ඝ කිරීම යන හේතු සාධක මත මෙම යෝජනා ක්‍රමයේ අරමුදල 2010 වර්ෂයේ මැදභාගය වන විට ශුන්‍ය විය. මෙම හේතුව මත 2011 දෙසැම්බර් මස දක්වා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සහ මණ්ඩලය මඟින් පවත්වාගෙන ගිය වෙනත් අරමුදල් යොදාගනිමින් 2011 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම් කරන ලදී. කෙසේ වුවද අරමුදල් සම්පාදනය නොවීම මත 2012 වර්ෂයේ ජනවාරි මස සිට 2013 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම අකර්මන්‍ය විය. එහෙත් මරණ හා බෙලහීන දීමනා ලාභීන්ට එම දීමනාව අඛණ්ඩව ගෙවන ලදී. මෙම යෝජනා ක්‍රමයට 2012 වර්ෂය දක්වා දායකත්ව අරමුදල් වශයෙන් අරමුදලට බැරවී ඇති මුදල රුපියල් මිලියන 3228 වන අතර විශ්‍රාම වැටුප් වශයෙන් රුපියල් මිලියන 6868 ක් ගෙවා තිබේ. 2012 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම නතර වන විට මෙම යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් ලබාගත් විශ්‍රාම වැටුප් ලාභීන් සංඛ්‍යාව 90573කි. (සටහන 01 )

මෙම යෝජනා ක්‍රමයේ ඇතිව තිබූ මූල්‍ය අර්බුදයට තිරසාර විසඳුමක් ලබා දී යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිසංවිධානයන් ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2014 අයවැය යෝජනා අනුව වැඩි ප්‍රතිලාභයක් සහිතව මෙම යෝජනා ක්‍රමය නව යෝජනා ක්‍රමයක් වශයෙන් නීතිගත කිරීමටත්, 2014 වර්ෂයේ ජනවාරි මස සිට නව යෝජනා ක්‍රමයට අනුරූප වන පරිදි වැඩි ප්‍රතිලාභයක් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම නැවත ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය පියවර ගන්නා ලදී.

ඒ අනුව 2013 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම වැටුප් ලබා ගැනීමට හිමිකම් දායකයින් 128659 ක් සඳහා 2014 වර්ෂයේ ජනවාරි මාසයේ සිට විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීමට පියවර ගෙන ඇත.

- **<u>මරණ බෙලහීනතා ප්‍රතිලාභ ගෙවීම.</u>**

ගොවි විශ්‍රාම වැටුප් අරමුදල සම්බන්ධයෙන් පැවති මූල්‍ය අර්බුදය මත 2012 වර්ෂයේ ජනවාරි මස සිට විශ්‍රාම වැටුප් ගෙවීම නතර වුවද මෙම යෝජනා ක්‍රමයට දායක වී මරණයට පත්වූ සහ බෙලහීනතාවයට පත් වූ දායකයින්ට තම මරණ පාරිතෝෂිත වශයෙන් රු: 9,140,504/= මුදලක් සහ බෙලහීනතා ප්‍රතිලාභ වශයෙන් රු: 124,570/= මුදලක් ද 2013 වර්ෂයේදී අඛණ්ඩව ප්‍රතිලාභීන් වෙත ගෙවීමට මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී. (සටහන 02 )

- **<u>ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්ව සමීක්ෂණය</u>**

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාගත් පුද්ගලයින් මෙම පනතේ ප්‍රකාරව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබා තිබේ ද යන්න සහ මෙම විශ්‍රාම වැටුප් ලාභීන් සම්බන්ධයෙන් වූ තොරතුරු ලබා ගැනීම පිණිස දීපව්‍යාපත සමීක්ෂණයක් 2013 වර්ෂයේ දෙසැම්බර් මසදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහාය ලබා ගනිමින් ක්‍රියාත්මක කරන ලද

අතර 2014 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් ගෙවීම් මෙම තොරතුරු පාදක කොටගෙන සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

- **<u>ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය</u>**

2013 වර්ෂය අවසන් වන විට දායකත්වය ලබා ඇති මුළු ධීවරයින් සංඛ්‍යාව 68560ක් වන අතර විශ්‍රාම වැටුප් ලාභීන් 2544ක් සඳහා රු: 30,068,226/= ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී. මෙම ගෙවීම් තැපැල් කාර්යාල 390ක් මඟින් සිදු කරන ලදී. (සටහන 03)

**<u>මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම</u>**

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයින් අතුරින් මරණයට පත් වූ දායකයින් 50 දෙනෙකු සඳහා රු:730,714/= ක මරණ පාරිතෝෂික මුදලක් ද බෙලහීනතා ප්‍රතිලාභ වශයෙන් එක් පුද්ගලයකු සඳහා රු: 40,000/= මුදලක් ද වශයෙන් ගෙවා ඇත. (සටහන 04)

## විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ ප්‍රගති වාර්තාව 2013-12-31 දිනට

| | දිස්ත්‍රික්කය | මුළු විශ්‍රාමික සංඛ්‍යාව | මුළු විශ්‍රාමිකයින් සඳහා ගෙවන මුදල | 1992 සිට මේ දක්වා ගෙවූ මුදල | තැපැල් කාර්යාල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 3606 | 3,671,498.00 | 257,057,499.00 | 167 |
| 2 | ගම්පහ | 6985 | 7,150,325.00 | 508,813,182.00 | 267 |
| 3 | කළුතර | 5882 | 5,977,524.00 | 435,104,209.00 | 165 |
| 4 | මහනුවර | 8850 | 9,042,635.00 | 702,995,185.00 | 382 |
| 5 | මාතලේ | 2392 | 2,465,610.00 | 180,284,097.00 | 112 |
| 6 | නුවරඑළිය | 2498 | 2,567,154.00 | 183,363,987.00 | 127 |
| 7 | ගාල්ල | 8760 | 8,966,913.00 | 744,928,857.00 | 261 |
| 8 | මාතර | 5837 | 5,954,299.00 | 433,463,775.00 | 240 |
| 9 | හම්බන්තොට | 4438 | 4,558,663.00 | 311,045,693.00 | 136 |
| 10 | යාපනය/කිලිනොච්චි | 1544 | 1,622,609.00 | 136,906,922.00 | 147 |
| 11 | මන්නාරම | 32 | 33,019.00 | 1,518,697.00 | 9 |
| 12 | වවුනියාව | 235 | 246,579.00 | 23,469,774.00 | 42 |
| 13 | මුලතිව් | 59 | 61,942.00 | 7,448,883.00 | 14 |
| 14 | මඩකලපුව | 588 | 613,130.00 | 51,680,431.00 | 69 |
| 15 | අම්පාර | 2426 | 2,513,944.00 | 194,418,169.00 | 111 |
| 16 | ත්‍රිකුණාමලය | 531 | 547,043.00 | 42,610,286.00 | 45 |
| 17 | කුරුණෑගල-මහව | 10094 | 10,357,950.00 | 716,418,299.00 | 364 |
| 18 | පුත්තලම | 3075 | 3,176,364.00 | 226,819,681.00 | 135 |
| 19 | අනුරාධපුරය/මහවැලි H | 3941 | 4,078,390.00 | 293,140,935.00 | 213 |
| 20 | පොලොන්නරුව- B G | 3031 | 3,127,218.00 | 231,769,380.00 | 203 |
| 21 | බදුල්ල/මහවැලි සි | 3650 | 3,743,157.00 | 278,656,007.00 | 216 |
| 22 | මොණරාගල | 2746 | 2,861,553.00 | 216,690,559.00 | 94 |
| 23 | රත්නපුරය/උඩවලව | 4162 | 4,269,904.00 | 317,394,528.00 | 211 |
| 24 | කෑගල්ල | 5211 | 5,306,231.00 | 372,349,356.00 | 235 |
| | **එකතුව** | **90573** | **92,913,654.00** | **6,868,348,391.00** | **3965** |

**(2012 ජනවාරි සිට 2013 දෙසැම්බර් 31 දක්වා විශ්‍රාම වැටුබප් ගෙවීම් සිදුකොට නොමැත.)**

| | ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය<br>2013 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා - මරණ හා බෙලහීන ප්‍රතිලාභ ගෙවීම. | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | දිස්ත්‍රික්කය | මරණ | ගෙවූ මුදල | බෙලහීන | ගෙවූ මුදල | මුළු සංඛ්‍යාවේ | මුළු මුදල |
| | | සංඛ්‍යාව | රුපියල් | සංඛ්‍යාව | රුපියල් | එකතුව | රුපියල් |
| 1 | කොළඹ | 06 | 156,687.00 | | | 6 | 156,687.00 |
| 2 | ගම්පහ | 25 | 346,166.00 | | | 25 | 346,166.00 |
| 3 | කළුතර | 18 | 358,878.00 | | | 18 | 358,878.00 |
| 4 | මහනුවර | 28 | 474,294.00 | | | 28 | 474,294.00 |
| 5 | මාතලේ | 12 | 272,848.00 | | | 12 | 272,848.00 |
| 6 | නුවරඑළිය | 11 | 219,776.00 | | | 11 | 219,776.00 |
| 7 | ගාල්ල | 28 | 588,416.00 | | | 28 | 588,416.00 |
| 8 | මාතර | 19 | 372,874.00 | | | 19 | 372,874.00 |
| 9 | හම්බන්තෙ | 24 | 356,193.00 | 1 | 42,218.00 | 25 | 398,411.00 |
| 10 | යාපනය | 18 | 401,151.00 | | | 18 | 401,151.00 |
| 11 | මන්නාරම | 00 | - | | | - | - |
| 12 | වව්නියාව | 10 | 192,821.00 | | | 10 | 192,821.00 |
| 13 | මුලතිව් | 00 | - | | | - | - |
| 14 | මඩකලපුව | 12 | 243,034.00 | | | 12 | 243,034.00 |
| 15 | අම්පාර | 00 | - | | | - | - |
| 16 | ත්‍රිකුණාමල | 00 | - | | | - | - |
| 17 | පුත්තලම | 14 | 277,756.00 | 1 | 28,642.00 | 15 | 306,398.00 |
| 18 | කුරුණෑගල | 45 | 929,447.00 | | | 45 | 929,447.00 |
| 19 | මහව | 00 | - | | | - | - |
| 20 | අනුරාධපුර | 56 | 1,158,235.00 | | | 56 | 1,158,235.00 |
| 21 | පොලොන | 17 | 314,443.00 | 1 | 29,495.00 | 18 | 343,938.00 |
| 22 | මොණරාග | 25 | 548,503.00 | | | 25 | 548,503.00 |
| 23 | බදුල්ල | 17 | 409,022.00 | | | 17 | 409,022.00 |
| 24 | රත්නපුරය | 19 | 394,131.00 | | | 19 | 394,131.00 |
| 25 | කෑගල්ල | 28 | 559,725.00 | | | 28 | 559,725.00 |
| 26 | මහවැලි."H | 08 | 169,751.00 | 1 | 24,215.00 | 9 | 193,966.00 |
| 27 | මහවැලි.B" | 13 | 335,157.00 | | | 13 | 335,157.00 |
| 28 | මහවැලි."C | 00 | - | | | - | - |
| 29 | මහවැලි."G | 00 | - | | | - | - |
| 30 | උඩවලව | 03 | 61,196.00 | | | 3 | 61,196.00 |
| | එකතුව | 456 | 9,140,504.00 | 4 | 124,570.00 | 460 | 9,265,074.00 |

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

### 2013.12.31 දිනට බඳවා ගැනීම්

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | වයස අනුව දායක සංඛ්‍යාව | | | | | | 2013දෙසැ. 31 දක්වා මුළු දායක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | 18-29 | 30-35 | 36-45 | 46-50 | 51-54 | 55-59 | |
| කළුතර | 1213 | 721 | 772 | 197 | 105 | 59 | 3067 |
| ගාල්ල | 1082 | 676 | 840 | 221 | 118 | 95 | 3032 |
| මහවැව | 3253 | 1701 | 2036 | 612 | 254 | 240 | 8096 |
| මාතර | 1747 | 973 | 1226 | 345 | 197 | 164 | 4652 |
| කොළඹ | 576 | 359 | 478 | 140 | 63 | 38 | 1654 |
| තංගල්ල | 2508 | 1386 | 1625 | 409 | 198 | 166 | 6292 |
| පුත්තලම | 2166 | 1156 | 1222 | 255 | 107 | 61 | 4967 |
| මීගමුව | 2538 | 1598 | 2159 | 733 | 416 | 376 | 7820 |
| මඩකලපුව | 2245 | 1390 | 1630 | 555 | 265 | 264 | 6349 |
| ත්‍රිකුණාමලය | 654 | 516 | 550 | 129 | 81 | 78 | 2008 |
| මන්නාරම | 2035 | 1211 | 1307 | 409 | 205 | 227 | 5394 |
| කල්මුනේ | 1565 | 1109 | 1515 | 479 | 242 | 206 | 5116 |
| මුලතිව් | 88 | 79 | 141 | 50 | 27 | 44 | 429 |
| කිලිනොච්චි | 519 | 340 | 540 | 250 | 185 | 183 | 2017 |
| යාපනය | 2105 | 1056 | 1398 | 648 | 381 | 586 | 6174 |
| | | | | | | | ***67067*** |
| **මිරිදිය ධීවර ජලාශ** | | | | | | | |
| නුවරඑළිය | 29 | 28 | 47 | 7 | 1 | 3 | 115 |
| පොළොන්නරුව | 45 | 35 | 27 | 11 | 2 | 1 | 121 |
| රත්නපුර | 27 | 15 | 9 | 1 | 3 | - | 55 |
| මොණරාගල | 17 | 14 | 10 | 1 | - | - | 42 |
| කුරුණෑගල | 45 | 24 | 24 | 1 | - | 2 | 96 |
| අනුරාධපුර | 169 | 81 | 84 | 17 | 7 | 5 | 363 |
| මාතලේ | 31 | 14 | 23 | 5 | 2 | 3 | 78 |
| නුවර | 13 | 12 | 25 | 5 | 3 | 3 | 61 |
| කෑගල්ල | 1 | 1 | 2 | - | - | - | 4 |
| බදුල්ල | 59 | 33 | 33 | 3 | - | 3 | 131 |
| වව්නියා | 59 | 33 | 41 | 15 | 4 | - | 152 |
| මඩකලපුව මිරිදිය | 84 | 52 | 67 | 27 | 20 | 25 | 275 |
| එකතුව | | | | | | | ***1493*** |
| මුළු එකතුව | **24873** | **14613** | **17831** | **5525** | **2886** | **2832** | **68560** |

* 2013 /12/31 දිනට ධීවර විශ්‍රාම වැටුප් ලාභීන් සංඛ්‍යාව - 2544

## ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## 2013 වර්ෂය තුල මරණ / බෙලහීනතා පාරිතෝෂික ගෙවීම්

| දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය | මරණ පාරිතෝෂික ගෙවීම් | | | බෙලහීනතා ගෙවීම් | | |
|---|---|---|---|---|---|---|
| | දායක සංඛ්‍යාව | මුදල | | පූර්ණ | අර්ධ | මුදල |
| කලුතර | 1 | 10,000.00 | | - | - | - |
| ගාල්ල | - | - | | - | - | - |
| මහවැව | 3 | 29,000.00 | | | - | - |
| මාතර | - | - | | - | - | - |
| කොළඹ | 2 | 16,000.00 | | - | - | - |
| තංගල්ල | - | - | | 1 | - | 40,000.00 |
| පුත්තලම | - | - | | - | - | - |
| මීගමුව | 7 | 93,000.00 | | - | - | - |
| මඩකලපුව | 5 | 73,000.00 | | - | - | - |
| ත්‍රිකුණාමලය | 1 | 15,000.00 | | - | - | - |
| මන්නාරම | 2 | 18,000.00 | | - | - | - |
| කල්මුනේ | 2 | 16,000.00 | | - | - | - |
| මුලතිව් | 1 | 8,000.00 | | - | - | - |
| කිලිනොච්චි | 19 | 289,000.00 | | - | - | - |
| යාපනය | 6 | 143,714.00 | | - | - | - |
| **මිරිදිය ධීවර ජලාශ** | | | | | | |
| නුවරඑළිය | - | - | | - | - | - |
| පොළොන්නරුව | - | - | | - | - | - |
| රත්නපුර | - | - | | - | - | - |
| මොණරාගල | - | - | | - | - | - |
| කුරුණෑගල | - | - | | - | - | - |
| අනුරාධපුර | - | - | | - | - | - |
| මාතලේ | - | - | | - | - | - |
| නුවර | - | - | | - | - | - |
| කෑගල්ල | - | - | | - | - | - |
| බදුල්ල | - | - | | - | - | - |
| වව්නියා | - | - | | - | - | - |
| මඩකලපුව මිරිදිය | 1 | 20,000.00 | | - | - | - |
| එකතුව | 50 | 730,714.00 | | 1 | - | 40,000.00 |

# පරිපාලන හා මානව සම්පත් අංශය

# පරිපාලන හා මානව සම්පත් අංශය

**කාර්ය මණ්ඩලය**

2013.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**කාර්ය මණ්ඩල සංයුතිය**

| සේවා ගණය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | | | | |
| HM | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | - |
| HM | අධ්‍යක්ෂ | 5 | 1 | 4 |
| කළමනාකරණ | | | | |
| MM | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 45 | 33 | 12 |
| කනිෂ්ඨ කළමනාකරණ | | | | |
| JM | පරිපාලන නිලධාරි | 2 | - | 2 |
| | පද්ධති පරිපාලක | 1 | - | 1 |
| | මූල්‍ය නිලධාරි | 1 | - | 1 |
| | සැලසුම් නිලධාරි | 1 | - | 1 |
| ආශ්‍රිත නිලධාරි | | | | |
| ASS.O | සංවර්ධන නිලධාරි | 55 | 33 | 22 |
| | සැපයුම් නිලධාරි | 1 | 1 | - |
| | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | | | | |
| MA - Tech | ප්‍රවාහන සහකාර | 1 | 1 | - |
| | ලේකම් | 1 | - | 1 |
| | පොත් තබන්නා | 4 | 1 | 3 |
| | මෘදුකාංග/දෘඩාංග කාර්මික ශිල්පී | 1 | - | 1 |
| | කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) | 1 | - | 1 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | | | | |
| MA - NonTech | කළමනාකරණ සහකාර | 220 | 171 | 49 |
| ප්‍රාථමික (ශිල්පීය) | | | | |
| PL - Skilled | රියදුරු | 38 | 21 | 17 |
| ප්‍රාථමික (ශිල්පීය නොවන) | | | | |
| PL - Non Skilled | කාර්යාල සහායක | 42 | 32 | 10 |
| | | **421** | **295** | **126** |

**සේවක පුහුණු හා අධ්‍යාපන කටයුතු**

2013 වසර තුළ "නව ගිණුම් ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම" සම්බන්ධව ප්‍රාග් ඉන්ස්ටිටියුට් ආයතනය මෙහෙයවූ 2013.10.02 දින පැවති එක් දින වැඩමුළුවට නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) අයි.ජේ.ඒ.ධර්මවර්ධන මහතාද නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්) අයි.යූ.කේ.කළුආරච්චි මහතාද සහභාගී කරවන ලදී. එමෙන්ම එම ආයතනය මෙහෙයවූ 2013.10.10 දින පැවති "වැටුප් කළමනාකරණය හා වැටුප් පරිවර්තන පාඨමාලාව" සඳහා කළමනාකරණ සහකාරිනී ඩබ්.ඒ.යසවතී මිය, කළමනාකරණ සහකාරිනී චන්ද්‍රිකා කුලරත්න මිය හා කළමනාකරණ සහකාරිනී ඩබ්.චාන්දනී සෙනරත් මියද සහභාගී කරවන ලදී. තවද 2013.10.31 දින පැවති ICTAD ආයතනය මඟින් සංවිධානය කරන ලද "මනා සංවිධානය හා ක්‍රමවත් මිලදී ගැනීම්" සම්බන්ධව එක් දින පුහුණු වැඩමුළුව සඳහා මණ්ඩලයේ සැපයුම් නිලධාරි ඩබ්.ඒ.රංජිත් මහතා හා ගබඩාභාරකරු යූ.ඩී.පත්මසිරි මහතා සහභාගී කරවන ලදී.

මීට අතිරේකව මණ්ඩලයේ මෙහෙයුම් අංශයේ සංවිධායකත්වයෙන් 2013.08.17 දින කෘෂිකර්ම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පවත්වන ලද මණ්ඩලයේ නව ප්‍රවණතා පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන හා ඊට සමගාමී කනිෂ්ඨ කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන 2013.10.05 දින ප්‍රධාන කාර්යාලයේදී ද පවත්වන ලදී.

**සේවක සුභසාධනය**

මණ්ඩලයේ සේවකයින් සඳහා උදේ, සවස තේ සැපයීමේ වැඩපිළිවෙල හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පෙර වර්ෂයේදී මෙන් මෙම වර්ෂය තුළද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මීට අතිරේකව මණ්ඩලයේ සේවකයින්ගෙන් සැදුම් ලත් ක්‍රිකට් සමාජය විසින් පේරාදෙණිය උද්භිද උද්‍යානයේ සේවක සුභ සාධන සංගමය සමඟ සංවිධානය කරන ලද සුහද ක්‍රිකට් තරගයක් සංවිධානය කරන ලදී.

**ප්‍රසම්පාදන හා ප්‍රවාහන ක්ෂේත්‍රය**

2013 වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල අවශ්‍යතා වෙනුවෙන් කාර්යාල උපකරණ හා ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් පෙර වර්ෂ වලදී මෙන්ම කාර්යාල අවශ්‍යතා පරිදි සිදු කරන ලදී. මෙම වසර තුළ මණ්ඩලයේ වාහන සංචිතයට අයත් වාහනවල එදිනෙදා අලුත්වැඩියාවන් හා වාර සේවාවන් හැර වාහන මිලදී ගැනීම් වැනි කිසිවක් සිදු නොවීය.

**කාර්යාල ගොඩනැගිලි**

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය 2011 වසරේදී මෙන්ම මෙම වසර තුලදීද නො:117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදී. මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාල 25ක් පවත්වාගෙන යනු ලබන අතර, ඉන් මණ්ඩලයට අයත් ගොඩනැගිලි 06කි.

අනෙක් කාර්යාල මාසික කුලී පදනම මත රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි තුළ තව දුරටත් පවත්වාගෙන යනු ලබේ.

**<u>සේවක විනය කටයුතු</u>**

මණ්ඩලය විසින් හා මණ්ඩලයට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් 2013 වර්ෂය තුල ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විය.

ලිපිකරු කේ.ඒ.සුදත් බණ්ඩාර මයාට එරෙහිව පවරා ඇති B/520/03 නඩුව හා ක්ෂෙත්‍ර නිලධාරී කේ.ඒ.හීන්බණ්ඩාර මයාට එරෙහිව පවරා තිබූ B/2171/2 නඩුව අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේදී විභාග වෙමින් පවතී.

මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ සිදුවී ඇති ගොවි විශ්‍රාම වැටුප් වාර මුදල් වංචා කිරීමේ සිද්ධියට අදාළව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති B 3012/නඩුව විභාග වෙමින් පවතී.

සේවයෙන් ඉවත් කරනු ලැබ ඇති ඒ.කේ.එම්.ඉල්ලියාස් මයා විසින් පවරා ඇති 23/කු/6833/98 නඩුවේ අභියාචනා පෙත්සම කුරුණෑගල සිවිල් අභියාචනා මහාධිකරණයේදි පැමිණිල්ලේ වාසියට තීන්දු විය. මෙම නඩු තීන්දුවට විරුද්ධව මණ්ඩලය ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනාවක් ඉදිරිපත් කරන ලදී. පැමිණිලි පක්ෂයෙන්ද ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි. මීට අදාළ අවසාන නඩු විභාගය 2014 ජූලි මස 30 දිනට කැඳවා ඇත.

මණ්ඩලය විසින් ලංකා බැංකුවට එරෙහිව පවරනු ලැබ ඇති 21843,21844 හා 21845 දරණ නඩුවල ඒකාබද්ධ නියෝගයට එරෙහිව ලංකා බැංකුව ගොනු කර ඇති WP/HCCA/Col 312/2003 (f) දරණ අභියාචනා පෙත්සම සිවිල් අභියාචනා මහාධිකරණයේදී විභාග වෙමින් පවතී.

මහේෂි දිලිනි බුද්ධිකා මෙය පුහුණුව අවසන් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට එරෙහිව ඇඹිලිපිටිය කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති 6ඊ/7030/1/1 දරණ නඩුව විභාග වෙමින් පවතී.

ටෙරන්ස් වරුෂවිතාන මහතා මණ්ඩලයට එරෙහිව බදුල්ල කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති අංක 05/20356/2013 දරණ නඩුව විභාග වෙමින් පවතී .

කේ.එස්.එච්.සංජීව මහතා මණ්ඩලයට එරෙහිව මහරගම කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති අංක 33/1124/2013 දරණ නඩුව විභාග වෙමින් පවතී .

## 2013.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

### කාර්යය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය

පුරුෂ - 183

ස්ත්‍රී - 112

එකතුව - 295




### වයස් විශ්ලේෂණය

| වයස් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 56 - 60 | 22 | 7% |
| 51 - 55 | 75 | 25% |
| 46 - 50 | 48 | 17% |
| 41 - 45 | 37 | 13% |
| 36 - 40 | 51 | 17% |
| 31 - 35 | 45 | 15% |
| 30 ට අඩු | 17 | 6% |
| එකතුව | 295 | 100% |




### සේවා කාලය අනුව විශ්ලේෂණය

| අවුරුදු | සේවක සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 30 ට වැඩි | 10 | 2% |
| 26 - 30 | 71 | 14% |
| 21 - 25 | 40 | 23% |
| 16 - 20 | 25 | 8% |
| 15 ට අඩු | 149 | 53% |
| එකතුව | 295 | 100% |




### 2013 වර්ෂය තුළ විශ්‍රාම යාම් හා සේවයෙන් ඉවත්වීම්

පුරුෂ - 06

ස්ත්‍රී - 05

එකතුව - 11

### 2013 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්

බාහිර බඳවා ගැනීම් - නැත
අභ්‍යන්තර බඳවා ගැනීම් - 02
උසස් වීම - 10

# අභ්‍යන්තර විගණන අංශය

## අභ්‍යන්තර විගණන අංශය

### කාර්ය සඵල වාර්තාව

2013 වර්ෂය සඳහා, මණ්ඩලයේ ක්‍රියාත්මක යෝජනා ක්‍රම සඳහා ඒ ඒ අංශ සහ දිස්ත්‍රික් කාර්යාල අනුව පිළියෙල කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන පරිදි අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, මණ්ඩලයේ ක්‍රියාත්මක යෝජනා ක්‍රම වෙනුවෙන්, ප්‍රධාන කාර්යාලීය හා දිස්ත්‍රික් කාර්යාලීය මට්ටමින්, දිස්ත්‍රික් කාර්යාල (26) භූගෝලීය ව්‍යාප්තිය සහ මෙම අංශයේ සීමිත මානව සම්පත් (නියෝජ්‍ය අධ්‍යක්ෂ, විගණන ලිපිකරු, ලිපිකරු) ප්‍රමාණය මත වුවද පුහුණු වන්නන්ගේ සේවය ලබාගෙන අභ්‍යන්තර විගණන පරීක්ෂණ 60 ක් සිදුකරන ලදී.

එමෙන්ම, මණ්ඩලයේ සියළුම අංශ සහ දිස්ත්‍රික් කාර්යාල කටයුතු (ආවරණය වන පරිදි) වල ක්‍රියාත්මක පාලන ක්‍රම පිළිබඳව ඒවායේ ප්‍රමාණාත්මකභාවය හා ක්‍රියාකාරීත්වය ඇගයීම් කරමින් පහත ක්ෂේත්‍රයන් යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සිදුකරන ලදී.

පාලන අංශය සඳහා, සේවකයින් විශ්‍රාම ගැන්වීම, නව බඳවා ගැනීම් පටිපාටිය අනුව සේවකයින් අන්තර්ග්‍රහනය කිරීම, දිස්ත්‍රික් කාර්යාලීය පැමිණීම, නිවාඩු, තොග ලේඛණ පවත්වා ගැනීම, ණය මුදල් නිකුත් කිරීම, අය නොවන ආපදා ණය ශේෂ අයකර ගැනීම, වැටුප් වර්ධක ගෙවීම් හා වැටුප් පියවරෙහි පිහිටුවීම්, පැමිණීම හා නිවාඩු, දිස්ත්‍රික් කාර්යාලයීය පැමිණීම/ නිවාඩු වාර්තා එවීම. අත්තිකාරම් පියවීම් පරීක්‍ෂණ කටයුතු සිදුකර ඇත.

මීට අමතරව, අතිකාල ගෙවීම, ලිපි බෙදා හැරීම්, ධාවන සටහන්, වාහන පරිහරණය, ස්ථාවර වත්කම් මිලදී ගැනීම, ගබඩා කටයුතු, සහ නීතිමය කටයුතු, වලට අදාල පරීක්‍ෂණ කටයුතු සිදුකරන ලදී.

මුදල් අංශයේ කටයුතු වලට අදාළව, මුදල් පොත් හා බැංකු සැසඳුම් පරීක්ෂාවන් යටතේ ණය සහ අත්තිකාරම් ගිණුම, සුවසෙත රක්ෂණ ගිණුම, පශු සම්පත් රක්ෂණ ගිණුම, ප්‍රාග්ධන ගිණුම, මරණ බෙලහීන වන්දි ගිණුම, ගොවි විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම, වී වගා රක්ෂණ ගිණුම, ධීවර විශ්‍රාම වැටුප් මරණ බෙලහීන වන්දි ගෙවීම් ගිණුම, ධීවර විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම, වෛද්‍යාධාර ගිණුම, අතිරේක භෝග වගා රක්ෂණ ගිණුම, පරීක්‍ෂාකර ඇත.

මුදල් පොත්, සහ ගෙවීම් වව්චර් පරීක්ෂාව යටතේ, කෘෂි රක්ෂණ පරිපාලන ගිණුම, ධීවර විශ්‍රාම වැටුප් පරිපාලන ගිණුම, ධීවර විශ්‍රාම වැටුප් මරණ බෙලහීන වන්දි ගෙවීම් ගිණුම, ප්‍රාග්ධන ගිණුම, වෛද්‍යාධාර යෝජනා ක්‍රමය, සුවසෙත රක්ෂණ ගිණුම, වී වගා රක්‍ෂණ වන්දි ගිණුම සහ අතිරේඛ බෝග වන්දි ගිණුම පරීක්‍ෂා කරන ලදී.

මීට අමතරව, පුනරාවර්ථන ප්‍රතිපාදන ලැබීම්, වී වගා රක්‍ෂණ වාර මුදල් අය වීම් ප්‍රේෂනය කිරීම, කුවිතාන්සි පොත් නිකුත් කිරීම්, පශු රක්‍ෂණ වාර මුදල් අය වීම් ප්‍රේෂනය කිරීම, සහ අතිරේක භෝග වාර මුදල් ලැබීම් පරීක්‍ෂා කර ඇත. තවද, ආයෝජන පිළිබඳ පරීක්ෂාව, ස්ථාවර වත්කම් පිළිබඳ පරීක්ෂාව, නියෝජිත ආයතන මගින් ලැබිය යුතු ශේෂ පිළිබඳ පරීක්ෂාව, ණය ගෙවීම්, අත්තිකාරම් පියවීම් යන පරීක්‍ෂණ සිදුකර ඇත. දිස්ත්‍රික් පරිපාලන ගිණුම් යටතේ, මනම්පිටිය, බදුල්ල සහ දිස්ත්‍රික් කාර්යාලීය රැස්කිරීමේ ගිණුම යටතේ බදුල්ල යන පරීක්ෂන කටයුතු ද සිදු කරන ලදී.

රක්‍ෂණ අංශයේ කටයුතු ආවරණය වන පරිදි, පශු රක්‍ෂණ යෝජනා පත්‍ර හා වාරික මුදල් අයකිරීම ප්‍රේෂණය කිරීම, ණය දෙන ආයතන මගින් රක්‍ෂණය කිරීම වාර මුදල් අයකිරීම ප්‍රේෂණය කිරීම, කුවිතාන්සි පොත් පාලනය යන පරීක්‍ෂණ කටයුතු සිදුකරන ලදී. තවද, පශු සම්පත් රක්‍ෂණ ප්‍රතිලාභ ගෙවීම් පරීක්ෂාව (නුවර එළිය, මහනුවර, කෑගල්ල), සුවසෙත රක්‍ෂණ ප්‍රතිලාභ ගෙවීම්, වී වගා රක්‍ෂණ වන්දි ගෙවීම්(බදුල්ල, මඩකලපුව), තල වගා වන්දි ගෙවීම් (අනුරාධපුරය) යන පරීක්‍ෂණ කටයුතු සිදුකරන ලදී.

මෙහෙයුම් අංශයේ කටයුතු ආවරණය වන පරිදි ඉදිරි වැඩසටහන් ඉදිරිපත් කිරීම හා ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවීම, ඉලක්ක ඉටු කිරීම, සමස්ථ ප්‍රගතිය (ක්‍රියාකාරී සැලැස්ම අනුව) පිළිබද පරීක්ෂා කිරීම යන පරීක්‍ෂණ කටයුතු සිදුකර ඇත.

විශ්‍රාම වැටුප් අංශයට අදාළව, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ආපසු ගෙන්වා ගැනීම, මරණ හා ප්‍රතිලාභ ගෙවීම, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ හිග මුදල් මුදල් අය කිරීම (නියොජිත ආයතන මගින්), ඒක පුද්ගල ගිණුම් පරීක්ෂාව, මරණ පාරිතෝෂික ගෙවීම් සහ පරිපාලන වියදම් ගෙවීම් පිළිබද පරීක්‍ෂණ සිදුකරන ලදී.

දිස්ත්‍රික් කාර්යාල පරීක්‍ෂාව යටතේ මනම්පිටිය, බදුල්ල දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු පරීක්‍ෂා කරන ලදී.

# මුදල් අංශය

## <u>මූල්‍ය සම්පිණ්ඩනය</u>

2013 වර්ෂයේදී 2012 හා සැසඳීමේ දි කෘෂිරක්ෂණ යෝජනා ක්‍රමයේ ආදායමේ පසු බෑමක් පෙන්නුම් කරයි. 2011 දී රු.මි.157.4 ක් වූ වාරික ආදායම 2012 දී රු.මි. 124.7 ක් ලෙස සටහන් විය. මෙම වර්ෂයේ දී එම ආදායම රු. මි. 93.8 දක්වා පහත වැටුණි. එසේම මෙම වර්ෂය තුළ දී රු.මි.166.4 ක වන්දි ගෙවීමට සිදුවන නිසා ප්‍රවර්ථන වර්ෂය තුලදී යෝජනා ක්‍රමය ශුද්ධ අලාභදායී තත්වයක් ද පෙන්නුම් කරයි.

මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයද ප්‍රවර්ථන වර්ෂය තුළදී ද අර්බුදකාරී තත්වයකට මුහුණ පෑමට සිදු වූ අතර අරමුදල් සපයා ගැනීමට නොහැකි වූ නිසා 2013 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද කිරීමට සිදු විය.

එසේ වුව ද 2014 වර්ෂයේ අය වැය යෝජනා මගින් වයස අවුරුදු 63 සම්පූර්ණ වූ ගොවීන්ගේ අවම විශ්‍රාම වැටුප රු. 1,250 දක්වා වැඩි වන පරිදි නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සැකසීමටත් ඒ සඳහා අවශ්‍ය අර මුදල් සපයා ගැන්ම වෙනුවෙන් ගොවි සෙත ලොතරැයි ආදායමට අමතරව රු. මි. 1000 ක භාණ්ඩාගාර බැඳුම් කරයක් ලබා දීමටත් යෝජනා කරන ලදි.

ලාභදායීත්වය

- කෘෂි රක්‍ෂණ යෝජනා ක්‍රමය




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|
| මෙහෙයුම් වියදම(රු.මිලි) | 31.1 | 36.7 | 274.3 | 67.4 | 135.2 | 170.9 |
| වාරික රක්ෂණ ආදායම(රු.මිලි.) | 70.5 | 83.3 | 105.1 | 157.4 | 124.7 | 93.8 |

කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ ප්‍රතිව්‍යුහගත වැඩ පිළිවෙලට අනුකූලව රක්‍ෂණ කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම නිසා 2007 වර්ෂයේදී පැවති කෘෂි රක්‍ෂණ ආදායම වූ රුපියල් මිලියන 27.7ක ප්‍රමාණය 2008 වර්ෂයේදී මිලියන 70.5 දක්වා වැඩි විය. එම වැඩපිළිවෙල අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම නිසා 2011 වර්ෂයේදී මෙම කෘෂි රක්ෂණ ආදායම වාර්තා ගත ලෙස රුපියල් මිලියන 157 දක්වා ඉහළ නංවා ගැනීමට හැකි වුවද මණ්ඩලය මුහුණ දුන් බැරෑරුම් තත්වය හමුවේ 2012 වර්ෂයේ දී කෘෂි රක්ෂණ ආදායම රු.මි.124.7 ක් ලෙස පසුබෑමකට ලක් වූ අතර 2013 වර්ෂයේ දී ඇති වූ අයහපත් කාළගුණ තත්වය නිසා කෘෂි රක්ෂණ ආදායම 93.8 දක්වා තව දුරටත් පසු බෑමකට ලක් විය.

## ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය




| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| ආදායම | 501 | 431 | 282 | 154 | 110 | 58.1 | 38 |
| මෙහෙයුම් වියදම | 740 | 868 | 1016 | 1106 | 1282 | 1433 | 1693 |

- **<u>ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය</u>**

2004 වර්ෂයේ සිටම යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් වාර්තා වී නොමැත. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇති කරුණු අතර, වාරික ආදායම වැඩි නොකොට අවම විශ්‍රාම වැටුප රු.200 සිට රු.1,000 දක්වා වැඩි කිරීම හා වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීම නිසා වසරකට අළුතින් විශ්‍රාම වැටුප්ලාභීන් 15,000 ක් පමණ එකතුවීම මත සිදුවේ. කෙසේ වුවද ප්‍රවර්ථන වර්ෂය තුළදී ගොවි විශ්‍රාම වැටුප සඳහා අළුතින් දායකයින් බඳවා ගැනීම ප්‍රවර්ධනය නොකරන ලදී. මූල්‍යමය ශක්‍යතාවයකින් තොර යෝජනා ක්‍රමයක් ප්‍රවර්ධන කිරීම ඉදිරියේදී දැඩි ගැටළුකාරී තත්ත්වයකට මුහුණපෑම තවත් උග්‍රවන කටයුත්තක් වන බැවින් මෙම යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීම් ප්‍රචාරණය නොකිරීම සිදුකරන ලදී. 2010 අගෝස්තු මාසය තුළදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශුන්‍ය කරා ළඟා වූ අතර, මණ්ඩලය සතුව තිබූ අනෙකුත් අරමුදල් උපයෝගී කර ගැනීමෙන් හා භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් මෙම වසරේ ඔක්තෝම්බර් මාසය දක්වා විශ්‍රාම වැටුප ගෙවීම සිදු කරන ලදී. දැනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී ඇති ගොවීන් වෙනුවෙන් රුපියල් බිලියන 49.8 ක පමණ වගකීමක් පවතින බවට ඇස්තමේන්තු කර ඇත. අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතාවය නිසා 2013 වර්ෂය සඳහා කිසිදු මාසයක ගොවි විශ්‍රාම වැටුප් ගෙවීමක් සිදු කිරීමට නොහැකි වී ඇත.

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ
යෝජනා ක්‍රමය




| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|
| මෙහෙයුම් වියදම | 16 | 19 | 22 | 25 | 28 | 32.5 | 40.5 |
| ආදායම | 58 | 82 | 85 | 62 | 40 | 59.8 | 51.7 |

- <u>ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය</u>

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී ඇති ධීවර ජනතාව වෙනුවෙන් මණ්ඩලය සතු වගකීම රුපියල් බිලියන 2.3 ක් පමණ වන අතර මණ්ඩලය සතු අරමුදල් මඟින් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පවත්වාගෙන යාමට මේ වන තෙක් සමත් වී ඇත. කෙසේ වුවද පවතින යෝජනා ක්‍රමය දිගින් දිගටම ක්‍රියාත්මක වුවහොත් වර්ෂ 2022 වන විට ධීවර විශ්‍රාම වැටුප් අරමුදලද ශුන්‍ය කරා ළඟාවනු ඇතැයි ගණන් බලා ඇත.

# සමස්ථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන

# 2013

**කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**මූල්‍ය තත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය**
**2013 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා**

| | 2013 | 2012 |
|---|---|---|
| **වත්කම්** | | |
| ***ජංගම නොවන වත්කම්*** | | |
| දේපල, පිරියත සහ උපකරණ | 12,347,745.48 | 16,808,881.64 |
| ***ජංගම වත්කම්*** | 399,620,308.22 | 468,652,106.15 |
| **මුළු වත්කම්** | **411,968,053.70** | **485,460,987.79** |
| **ස්කන්ධ සහ බැරකම්** | | |
| ***ප්‍රාග්ධන සහ සංචිත*** | | |
| කෘ.ර.ම. සමුච්චිත (හිඟය)/ අතිරික්තය | (23,902,194.69) | 57,219,657.79 |
| රජයේ ප්‍රදානය ප්‍රාග්ධන | 9,870,305.50 | 10,646,168.92 |
| රජයේ ප්‍රදානය | 50,000,000.00 | 50,000,000.00 |
| ගොවි විශ්‍රාම වැටුප් අරමුදල | (53,971,641,745.77) | (48,945,122,405.64) |
| සමූහ රක්ෂණ අරමුදල- ගො.වි.වැ | 647,785,238.94 | 572,821,505.88 |
| F.A.O. ප්‍රදානය | 547,885.14 | 547,885.14 |
| සමූහ රක්ෂණ දායක මුදල | 1,000,000.00 | 1,000,000.00 |
| ධීවර විශ්‍රාම වැටුප් අරමුදල | (1,711,866,161.54) | (1,529,127,538.52) |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල | 2,760,941.56 | 2,355,867.72 |
| සමූහ රක්ෂණ අරමුදල - FHS | 20,210,079.70 | 19,198,329.70 |
| අනෙකුත් අරමුදල් | | |
| කෘ.ගො.ර.ම. සංචිත අරමුදල | 15,883,054.25 | 15,883,054.25 |
| | **(54,959,352,596.91)** | **(49,744,577,474.76)** |
| ***ජංගම නොවන වත්කම්*** | | |
| ධීවර විශ්‍රාම වැටුප් බැරකම | 2,344,270,819.00 | 2,149,338,000.00 |
| ගොවි විශ්‍රාම වැටුප් බැරකම | 49,802,609,120.27 | 46,513,730,000.00 |
| ගොවි භාරකාර අරමුදල- ණය | | 1,381,000.19 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 67,044,615.00 | 63,086,037.60 |
| | **52,213,924,554.27** | **48,727,535,037.79** |
| ජංගම බැරකම් | 3,157,396,096.34 | 1,502,503,424.76 |
| **මුළු ස්කන්ධ** | **411,968,053.70** | **485,460,987.79** |

**කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය**
**විස්තීර්ණ ආදායම් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය**
**2013 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා**

| | කෘ.ගො.ර.ම | ගොවි | ධීවර | 2,013 | 2012 |
|---|---|---|---|---|---|
| **ආදායම්** | | | | | |
| වාරික- රක්ෂණ | 93,854,060 | - | - | 93,854,060 | 124,708,184 |
| ධීවර විශ්‍රාම වැටුප් එකතුව | | 36,196,017 | | 36,196,017 | 55,475,042 |
| පොළිය - කෘෂෙගාරම් | 7,684,352 | | | 7,684,352 | 11,988,081 |
| පොළිය - ගො.වි.වැ. යෝජනා ක්‍රමය | | 1,869,928 | | 1,869,928 | 2,702,921 |
| ධීවර විශ්‍රාම වැටුප් එකතුව | | | 2,904,747 | 2,904,747 | 3,442,393 |
ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩු කොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධිකායයක් සහ සඵල පොළී ක්‍රමවේදයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

### (ඇ) කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන

ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ ස්ථාවර කල්පිරීම් මණ්ඩලයට කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මත අභිප්‍රායක් සහ හැකියාවක් ඇති විටදී ඒවා කල් පිරීම දක්වා රඳවා ගැනීම සේ වර්ගීකරණය කරනු ලැබේ. මූලික ගණනය කිරීමෙන් පසුව කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන හානි අඩු කොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානි හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන, කල්පිරීම දක්වා රඳවා ගනු ලැබූ ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබේ.

### (ඇ) විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික පිළිගැනීමට පසුව, ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ. විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළී ආදායම සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ. ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට, අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

### 2.4.1 මූල්‍ය වත්කම් හානි

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත ශේෂ වේ.

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ.

## 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 -'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' සහ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

## 3.2 බදුකරණය

1990 අංක 22 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධන ප්‍රකාරව මණ්ඩලය ආදායම් බද්දෙන් නිදහස් කර තිබේ.

## 3.3 ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ.

මණ්ඩලයේ ප්‍රාග්ධන වෙන්කිරීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

## 3.4 ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම්

ධීවර විශ්‍රාම අරමුදලේ බැරකම්, 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනයකිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

## 3.5 ප්‍රදාන

### 3.5.1 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරනලද වියදම් සඳහා මණ්ඩලයට හානි පූරණය කරන පුදාන එම වියදම් පිළිගනු ලැබූ කාල සීමාව තුළදීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ආදායමක් ලෙස පිළිගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට හානි පූරණය කරන ප්‍රදාන , ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

## 4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

## 4.1 ආදායම

c) මණ්ඩලයේ ආදායම රක්ෂණ වාරික, භාණ්ඩාගාර බිල්පත්වලින් සහ සේවක ණය සඳහා පොළී ආදායම සහ අනෙකුත් විවිධ ආදායම් නියෝජනය කරයි.

d) වාරික එකතු කිරීමෙන් ලත් සියලුම ආදායම් මුදල් පදනමකින් පිළිගනු ලැබේ.

**4.2** **ආදායම පිළිගැනීම**

අ. රක්ෂණ වාරික ආදායම බඳවාගත් කාලය සඳහා පිළිගනු ලැබේ.

ආ. ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර අදාළ වියදම් සමග ගලපනු ලැබේ.

ඇ. උපචිත ආදායම කාල පදනමකින් උපචිත වේ.

**4.3** **වියදම**

දරන ලද පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමයන්ගේ ඉපැයුම අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබයි. මණ්ඩලයේ ක්‍රියාකාරකම් මෙහෙයවීමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයකින් පවත්වාගෙන යාමේදී දරන ලද සියලු වියදම්, වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය කරා ළඟා වීමේදී උපචිත පදනමකින් ආදායමට බැර කොට ඇත.

**අංක 401/4 -15.10.2008 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම්**

| **වියදම්** | **අනුපාත** |
|---|---|
| කුලී, දුරකථන | 5% |
| තැපැල් ගාස්තු, ජල ගාස්තු | 5% |
| විදුලිය | 5% |
| කාර්යාල උපකරණ නඩත්තුව | 5% |
| ගොඩනැගිලි නඩත්තුව | 5% |
| Main M/V | 3% |
| ඉන්ධන | 2% |
| ලිපිද්‍රව්‍ය | 2% |
| නිල ඇඳුම් | 2% |
| ආරක්ෂාව | 5% |
| පරිගණක වියදම් | 5% |

**5.** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

යෝජනා ක්‍රමයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත්තේ ''වක්‍ර ක්‍රමය'' යොදා ගනිමින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිය -07 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' ප්‍රකාරව සකස් කර ඇත.

**6** **වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල වාස්තවිකත්වය සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

**7** **ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. මුල්වරට යොදාගැනීම**

2013 මාර්තු 31න් අවසන් වසර සඳහා සකස්කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී.ල.මූ.වා./ ශ්‍රී.ල.ගි. ප්‍රමිතිවලට අනුකූල වන පරිදි මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ ප්‍රථම වතාවය.

2012 මාර්තු 31 න් අවසන් වසර දක්වා සහ ඇතුලුව කාල සීමාවන් සඳහා. මණ්ඩලය සිය මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.ගි.ප්‍ර.) අනුකූලවය.

ඒ අනුව, 2013 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පසු අවසන් වන කාල සීමා සඳහා අදාලවන්නා වූ ශ්‍රී.ල.මූ.වා. ප්‍රමිති හා අනුකූල වන මූල්‍ය ප්‍රකාශන සමගින් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කර ඇති පරිදි 2012 දෙසැම්බර් 31 දිනට එදිනෙන් අවසන්වූ වසර සඳහා සංසන්දනාත්මක කාල සීමා දත්ත මණ්ඩලය පිළියෙල කර තිබේ. මෙම මූප්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, මූල්‍ය තත්වය පිළිබඳ ආරම්භක ප්‍රකාශය සකස්කරන ලද්දේ මණ්ඩලය ශ්‍රී.ල.මූ.වා. ප්‍රමිතිවලට සංක්‍රමණයවූ දිනය වූ 2012 ජනවාරි 01 දාය.

## 7.1 ආදේශ කළ විවර්ජන

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර- 1: ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් පිළිබඳ ප්‍රකාශය පළමු වරට යොදා ගැනීමේදී, පළමු වරට එම ප්‍රමිති යොදා ගන්නන්ට ඇතැම් ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. අතීතානුබද්ධව ආදේශ කිරීමේදි යම් විවර්ජන සඳහා ඉඩ ලබාදෙයි.

## 7.2 මණ්ඩලය පහත දැක්වෙන දෑ ආදේශ ක

### 7.2.1 සාධාරණ වටිනාකම හෝ අනුහන කරන ලද පිරිවැය ලෙස ප්‍රත්‍යාගණනය

සින්නක්කර දේපල, පිරියත සහ උපකරණ පිරිවැය ආදර්ශය යොදා ගනිමින් ශ්‍රී.ල.ගි.ප්‍ර. ප්‍රකාරව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර ඇත. සාධාරණ වටිනාකම අනුහන කරන ලද පිරිවැය ලෙස යොදා ගැනීම මණ්ඩලය තෝරා ගෙන නොමැත.

## 8. අනිශ්චිත අවස්ථා

**ලැබිය යුතු පොළී**

1996 දී භාණ්ඩාගාර බිල්පත් ආයෝජන මත පොළිය අහිමිවීම වෙනුවෙන් මණ්ඩලය ලංකා බැංකුවට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරන ලදී.

තොරතුරු පහත සඳහන් වේ.

| නඩු අංකය | මුදල(රුපියල්) |
|---|---|
| MR21843 | 1454670.84 |
| MR 21844 | 1172602.46 |
| MR 21845 | 2784657.55 |

නඩු තීන්දුව මණ්ඩලයට වාසි සහගත වුවද ලංකා බැංකුව එයට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනාවක් ඉදිරිපත් කර ඇත.

## 9. ශ්‍රී.ල.මු.වා.ප්‍ර. මුල්වරට යොදාගැනීම

**මූල්‍ය තත්වය සැසඳුම 2012 දෙසැම්බර් 31**

| | ශ්‍රීලගිප්‍ර 31.12.2012 රු.ශත | ප්‍රතිවර්ගීකරණය | ප්‍රතිමිනුම | IFRS 31.12.2012 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ***ජංගම නොවන වත්කම්*** | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 2,966.60 | | | 2,966.60 |
| | **2,966.60** | | | **2,966.60** |
| ***ජංගම වත්කම්*** | | | | |
| තොග | 170,081.30 | | | 170,081.30 |
| ලැබිය යුතු දෑ | 610,126,275.94 | | | 610,126,275.94 |
| ලැබිය යුතු පොළිය | 94,275.97 | (94,275.97) | | - |
| ආයෝජන | 35,376,535.64 | (35,376,535.64) | | - |
| කල්පිරීම දක්වා තබා ගත් මූල්‍ය සාධන පත්‍ර | | 35,470,811.61 | | 35,470,811.61 |
| බැංකුවේ ඇති මුදල් | 2,460,055.58 | | | 2,460,055.58 |
| | **648,227,224.43** | | | **648,227,224.43** |
| **මුළු වත්කම්** | **648,230,191.03** | | | **648,230,191.03** |
| **සම කොටස් සහ බැරකම්** | | | | |
| ***ප්‍රාග්ධන සහ සංචිත*** | | | | |
| ධීවර විශ්‍රාම වැටුප් අරමුදල | (1,529,127,538.52) | | | (1,529,127,538.52) |
| සමූහ ජීවිත රක්ෂණ අරමුදල | 19,198,329.70 | | | 19,198,329.70 |
| | **(1,509,929,208.82)** | | | **(1,509,929,208.82)** |
| ***ජංගම නොවන වත්කම්*** | | | | |
| විශ්‍රාම වැටුප් බැරකම | **2,149,338,000.00** | | | **2,149,338,000.00** |
| කාර්ය මණ්ඩල පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **942,945.00** | | | **942,945.00** |
| ***ජංගම බැරකම්*** | | | | |
| මුළු ගෙවිය යුතු දෑ | 6,647,429.85 | | | 6,647,429.85 |
| උපචිත වියදම් | 1,231, | | | 1,231,025.00 |
| බැංකු අයිරාව | | | | |
| | **7,878,454.85** | | | **7,878,454.85** |
| **මුළු සම කොටස් සහ බැරකම්** | **648,230,191.03** | | | **648,230,191.03** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**සටහන - 01**

2013 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත සහ උපකරණ

| විස්තරය | කාර්යාල උපකරණ | ප්‍රතිසාධන උපකරණ | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | පරිගණක | එකතුව |
|---|---|---|---|---|---|
| 2013 ජනවාරි 1 දිනට පිරිවැය | 380,728.50 | 1,325.00 | 50,376.92 | 259,515.00 | 691,945.42 |
| එකතු කළා. එකතුකිරීම් | - | - | - | - | - |
| අඩුකළා. බැහැරකිරීම් | - | - | - | - | - |
| **2013 දෙසැ.31 දිනට මුළු පිරිවැය** | **380,728.50** | **1,325.00** | **50,376.92** | **259,515.00** | 691,945.42 |
| ක්ෂයවීම් අනුපාතය | 10% | 10% | 10% | 20% | |
| සමුච්චිත ක්ෂයවීම 2013 ජනවාරි 31 දිනට | 380,409.90 | 1,325.00 | 50,376.92 | 256,867.00 | 688,978.82 |
| අඩුකළා. බැහැරකිරීම් | - | - | - | - | - |
| වර්ෂය සඳහා ක්ෂයවීම | 318.60 | | | 908.00 | 1,226.60 |
| **මුළු ක්ෂයවීම** | 380,728.50 | **1,325.00** | 50,376.92 | 257,775.00 | 690,205.42 |
| **ශුද්ධ වටිනාකම** | - | - | - | **1,740.00** | **1,740.00** |

| | | |
|---|---|---|
| **කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය** | | |
| **ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය** | | |
| **මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්** | | |
| 2013 දෙසැම්බර් 31 දිනට | | |
| | **31.12.2013** | **31.12.2012** |
| **සටහන 02 - තොග** | රු. ශත | රු. ශත |
| මුද්‍රණ ද්‍රව්‍ය | 154,252.55 | 170,081.30 |
| | **154,252.55** | **170,081.30** |
| **සටහන 03 - ලැබිය යුතු දෑ** | | |
| කෘ.ගො.ර.ම ජංගම ගිණුම | - | - |
| ගොවි විශ්‍රාම වැටුප් ණය | 638,676,801.39 | 608,316,450.94 |
| ලැබිය යුතු දෑ- FSH දෙපාර්තමේන්තුව | 1,500,000.00 | 1,500,000.00 |
| මරණ පාරිතෝෂික අත්තිකාරම් | 50,000.00 | 50,000.00 |
| ලැබිය යුතු වාරික | 155,688.00 | 259,825.00 |
| | **640,382,489.39** | **610,126,275.94** |
| **සටහන 04 -** | | |
| **කල්පිරීමේ තෙක් රඳවාගත් මූල්‍ය සාධන පත්‍ර** | | |
| භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව | 24,056,771.80 | 35,470,811.61 |
| | **24,056,771.80** | **35,470,811.61** |
| **බැංකුවේ ඇති මුදල්** | | |
| ගි.අංක. 164790 ලංකා බැංකු යුනියන් පෙදෙස | 511,697.23 | 156,865.23 |
| ගි.අංක. 164795 ලංකා බැංකු යුනියන් පෙදෙස | 846,931.29 | 2,303,190.35 |
| | **1,358,628.52** | **2,460,055.58** |
| **සටහන 06 - ධීවර විශ්‍රාම වැටුප් අරමුදල** | | |
| ඉදිරියට ගෙනා ශේෂය | (1,529,127,538.52) | (1,374,434,361.89) |
| අඩුකළා : ලැබිය යුතු පරිපාලන වියදම් | | - |
| විශ්‍රාම වැටුප් බැරකමේ වත්මන් වටිනාකම - 2009 දක්වා | | |
| පෙර වසරේ ගැලපුම | - | - |
| | (1,529,127,538.52) | (1,374,434,361.89) |
| වර්ෂය තුළදී එකතුකිරීම | | |
| වසර සඳහා මුළු අතිරික්තය/(හිඟය) | (182,738,623.02) | (154,693,176.63) |
| | (1,711,866,161.54) | (1,529,127,538.52) |
| | **(1,711,866,161.54)** | **(1,529,127,538.52)** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**2013 දෙසැම්බර් 31 දිනට**

| | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| **සටහන 7 - සමූහ ජීවිත රක්ෂණ අරමුදල** | | |
| එකතුකළා: | | |
| ආබාධිත පාරිතෝෂික ගෙවීම් | - | - |
| මරණ පාරිතෝෂික ගෙවීම් | (679,910.00) | (658,797.00) |
| | (679,910.00) | (658,797.00) |
| | **1,011,750.00** | **990,543.00** |
| | **20,210,079.70** | **19,198,329.70** |
| **සටහන 08 - ගෙවිය යුතු දෑ** | | |
| ගෙවිය යුතු - විශ්‍රාම වැටුප් ගෙවීම් | 1,644,753.00 | 310,059.00 |
| ගෙවිය යුතු- කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය | 8,704,380.10 | 5,596,546.85 |
| ගෙවිය යුතු - ආපසු ගෙවිය යුතු දායක මුදල | 119,391.00 | 189,740.00 |
| ගෙවිය යුතු - මරණ පාරිතෝෂිකය | 286,000.00 | 316,000.00 |
| ගෙවිය යුතු -දිරිදීමනා | 52,250.00 | 64,371.00 |
| ගෙවිය යුතු - දායක මුදල් මත ආපසු ගෙවන පොළිය | 72,846.00 | 170,713.00 |
| | **10,879,620.10** | **6,647,429.85** |
| **සටහන 9 - උපචිත වියදම්** | | |
| මුද්‍රණ ගාස්තු | 240,000.00 | 155,000.00 |
| නෛතික ගාස්තු | 17,000.00 | 17,000.00 |
| විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,159,025.00 | 1,059,025.00 |
| | **1,416,025.00** | **1,231,025.00** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. FB/E/AAIB/1/13/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 28 February 2015

The Chairman,
Agricultural and Agrarian Insurance Board

**Report of the Auditor General on the Financial Statements of the Agricultural and Agrarian Insurance Board for the year ended 31 December 2013**

---

Reference to my letter of even number dated 18 December 2014 on the above subject.

02. The above mentioned report is sent herewith.

W.P.C. Wickramaratne
Auditor General (Acting)

Copy to : Secretary, Ministry of Finance

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/ ඊ/ඒඑෆ්අයිබී/1/13/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 18 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 28 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2014 අගෝස්තු 22 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර )

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාරව රු.38,156,662 ක් වූ සේවක ණය හඳුනාගෙන මූල්‍ය වත්කම් ලෙස ගණනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආයු ගණක තක්සේරුව සහ ගිණුම්ගත කිරීම සිදුකර නොතිබූ අතර නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ වගකීම ඉටුකිරීම සඳහා සේවාදායකයා විසින් දායක මුදල් ආයෝජනය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.9,444,432 ක් වූ ලැබිය යුතු රක්ෂණ ආදායම සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ලැබිය යුතු රක්ෂණ ආදායම හා ගෙවිය යුතු රක්ෂණ කොමිස් මුදල් පිළිවෙලින් රු.9,444,432 කින් හා රු.377,778 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂය සඳහා ලැබිය යුතු රක්ෂණ ආදායම රු.1,533,034 ක් සමාලෝචිත වර්ෂය සඳහා රක්ෂණ ආදායම ලෙස හඳුනාගෙන තිබූ අතර එකතුව රු.1,615,560 ක් වූ සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රක්ෂණ ආදායම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පරිපාලන වියදම් රු.447,783 කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා ඌනතාවයද එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) රජයේ අමාත්‍යාංශයකට වත්කම් මාරු කිරීම සම්බන්ධයෙන් එම අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.256,520 ක මුදල් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) සාවද්‍ය ගිණුම්කරණ පරිචයන් අනුගමනය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය රු.1,872,818 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පොලී ගෙවීම්, ණය ගිණුමට හර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රු.274,500 ක් වූ ගොවි භාර අරමුදල් ණය ගිණුම් ශේෂ අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ගොවි විශ්‍රාම අරමුදලෙන් ලැබිය යුතු ණයවලින් අයකර ගත් රු.22,617,530 ක් වූ පොලී ආදායම සමාලෝචිත වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ආදායම හා වන්දි ගෙවීම් පිළිබඳව සංවර්ධන ශාඛාවේ විස්තරාත්මක උපලේඛනවල දැක්වෙන ප්‍රමාණයන් හා 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රමාණයන් අතර පහත දැක්වෙන පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

| **විෂයයන්** | **මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණයන්** | **සංවර්ධන ශාඛාවේ විස්තරාත්මක උපලේඛන අනුව ප්‍රමාණයන්** | **වෙනස ( කොමිස් මුදලෙන් පසුව )** |
|---|---|---|---|
| ---------- | ------------------- | ------------------------ | ------------------- |
| | රු. | රු. | රු. |
| **<u>ආදායම</u>** | | | |
| පශු සම්පත් | 8,897,267 | 7,419,539 | 1,477,728 |
| සුව සෙත හා ජීවිත | 1,266,494 | 784,535 | 481,959 |
| ගොවි උපකරණ | 436,918 | 736,683 | (299,765) |
| **<u>වන්දි ගෙවීම්</u>** | | | |
| පශු සම්පත් | 6,785,703 | 6,821,637 | (35,934) |
| වී | 150,022,999 | 118,647,831 | 31,375,168 |
| උපයෝගී වගා | 9,462,221 | 25,031,666 | (15,569,445) |
| සුවසෙත හා ජීවිත | 117,723 | 107,613 | 10,110 |

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවකයන්ගේ ණය සහ අත්තිකාරම් ශේෂයන් එකතුව රු.1,628,832 ක් දීර්ඝ කාලයක් අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල පැවතුණි. තවද ඉන් රු.950,185 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) මිය ගිය සේවකයන් සඳහා ගෙවිය යුතු පාරිතෝෂික එකතුව රු.320,944 ක් දීර්ඝ කාලයක් නිරවුල් කිරීමෙන් තොරව ගිණුම්වල පැවතුණි.

(ඇ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා 2010 සිට 2013 කාල පරිච්ඡේදය තුළ ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ලබාදෙන ලද රු.295,446,405 ක මුදලක් 2013 වර්ෂය අවසානය දක්වා අදාළ අරමුදලින් අයකර ගෙන නොතිබුණි.

(ඈ) පුද්ගලික සමාගමකට ගෙවිය යුතු රු.1,477,336 ක මුදලක් නිරවුල් කිරීමෙන් තොරව 2010 වර්ෂයේ සිට ගිණුම්වල පැවතුණි.

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශයට සහ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයට තාවකාලිකව මුදා හරින ලද සේවකයන්ගෙන් අයවිය යුතු රු.342,023 ක් වූ හිඟ වැටුප්, මණ්ඩලය විසින් අයකර ගෙන නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>** | |
| (i) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 හා 2009 ජූනි 01 දිනැති අංක 30(I) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ | මෙම චක්‍රලේඛවල විධිවිධානවලට පටහැනිව උසස්වීම් ලද සේවකයන්ට අදාළ වැටුප් පරිමාණ, උසස්වීම් නොලද සේවකයන් දෙදෙනෙකුට ගෙවා තිබුණි. |
| (ii) 2009 සැප්තැම්බර් 09 දිනැති අංක 30(II) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව වැටුප් පරිවර්තන ගණනය කිරීම හේතුවෙන් සේවකයන් 07 දෙනෙකුට රු.151,610 ක වැඩිපුර ගෙවීමක් කරන ඇති බවට විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. |
| **(ආ) <u>මුදල් රෙගුලාසි</u>** | |
| (i) මුදල් රෙගුලාසි 371 (2)(ආ) | රු.20,000 ක නිශ්චිත සීමාව ඉක්මවා අවස්ථා 16 කදී රු.495,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවා තිබුණි.<br><br>අවස්ථා නවයකදී රු.160,500 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීම ප්‍රමාද කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 751 | එක් එක් විෂය ශේෂයන් වෙනම හඳුනාගැනීම සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 454 | අවශ්‍ය පරිදි මණ්ඩලයේ එක් එක් අංශයන් සඳහා වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.150,920,566 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.78,743,127 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.72,177,439 ක පිරිහීමක් දැක්වුණි. පෙර වර්ෂයට සාපේක්ෂව රු.29,120,018 කින් හා රු.43,057,421 කින් පිළිවෙලින් ආදායමේ අඩුවීම හා වියදමේ වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර 2011 වර්ෂයේ හැර ඉකුත් වර්ෂ 5 ක හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ක්‍රමයෙන් අඩුවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | **2013** | **2012** | **2011** | **2010** | **2009** | **2008** |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| මුළු ආදායම | 109 | 139 | 175 | 128 | 114 | 96 |
| මුළු වියදම | 260 | 217 | 150 | 361 | 121 | 134 |
| රජයේ ප්‍රදානවලට පෙර අතිරික්තය / (ඌනතාවය ) | (151) | (78) | 25 | (233) | (7) | (38) |
| රජයේ ප්‍රදාන | 69 | 63 | 63 | 85 | 75 | 42 |
| රජයේ ප්‍රදානවලට පසු අතිරික්තය / (ඌනතාවය ) | (82) | 15 | 88 | (148) | 68 | 4 |

ඉහත තොරතුරු අනුව, මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සහාය නොමැතිව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හැකියාව සැක සහිත බව නිරීක්ෂණය විය.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1** **කාර්ය සාධනය**

-------------------

**රක්ෂණ යෝජනා ක්‍රම පරිපාලනය**

-------------------------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා රක්ෂණ යෝජනා ක්‍රමවල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විෂයය | මිනුම | ඉලක්කය | | | | ඉටුකර ගැනීම් | | | | ඉලක්කයන්හි ප්‍රතිශතයක් වශයෙන් ඉටුකර ගැනීම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | | භෞතික | | මූල්‍ය | |
| | | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 | 2012 |
| | | | | රු.000 | රු.000 | | | රු.000 | රු.000 | % | % | % | % |
| 1. වගා රක්ෂණය | | | | | | | | | | | | | |
| (අ) වී | අක්කර | 88,428 | 97,290 | 90,107 | 85,897 | 49,108 | 66,352 | 57,386 | 77,931 | 55.53 | 68.20 | 63.69 | 90.73 |
| (ආ) මිරිස් | අක්කර | 967 | 490 | 1,289 | 1,583 | 360 | 206 | 657 | 825 | 37.23 | 42.00 | 50.97 | 52.12 |
| (ඇ) ලොකු ළූණු | අක්කර | 1,364 | 1,125 | 4,450 | 3,328 | 1,233 | 1,538 | 4,364 | 4,086 | 90.40 | 136.71 | 98.07 | 122.77 |
| (ඈ) පොල් | අක්කර | 270 | 193 | 267 | 304 | - | - | - | - | - | - | - | - |
| (ඉ) උක් | අක්කර | 323 | 1,200 | 482 | 2,000 | 30 | - | 73 | - | 9.29 | - | - | - |
| (ඊ) බඩ ඉරිඟු | අක්කර | 9,922 | 12,530 | 17,917 | 19,208 | 6,857 | 6,618 | 12,856 | 10,441 | 69.11 | 52.81 | 71.75 | 54.87 |
| (උ) මල් පැල | සංඛ්‍යාව | 110,030 | 5,050 | 201 | 201 | - | - | - | - | - | - | - | - |
| (ඌ) අර්තාපල් | අක්කර | 800 | 1,280 | 2,000 | 3,200 | 824 | 732 | 3,815 | 2,886 | 103.00 | 57.18 | 190.75 | 90.00 |
| (එ) වෙනත් භෝග | අක්කර | 9,403 | 9,435 | 12,591 | 10,866 | 2,055 | 2,909 | 2,187 | 2,841 | 22.00 | 31 | 17.36 | 26.00 |
| (ඒ) එළවළු | අක්කර | 225 | 400 | 7,002 | 1,200 | 540 | 631 | 819 | 937 | 240.00 | 157.75 | 11.70 | 78.00 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2. | පශු සම්පත් | | | | | | | | | | | | | |
| | ගව | සංඛ්‍යාව | 9,428 | 10,096 | 21,604 | 23,381 | 3,077 | 4,856 | 6,637 | 11,899 | 32.63 | 48.09 | 30.72 | 50.89 |
| | එළු | සංඛ්‍යාව | 9,857 | 9,168 | 6,570 | 4,305 | 1,227 | 2,261 | 783 | 1,205 | 12.45 | 24.6 | 11.92 | 27.99 |
| 3. | ගබඩා | සංඛ්‍යාව | 464 | 860 | 3,028 | 3,810 | 0 | 17 | 0 | 238 | 0.00 | 1.97 | 0.00 | 6.25 |
| 4. | ගොවි උපකරණ | සංඛ්‍යාව | 3,450 | 4,109 | 13,559 | 13,625 | 87 | 316 | 736 | 4,484 | 2.52 | 7.69 | 5.44 | 32.91 |
| 5. | සුවසෙත | සංඛ්‍යාව | 27,576 | 33,715 | 16,349 | 14,946 | 1,566 | 2,013 | 785 | 1,040 | 5.68 | 5.97 | 4.80 | 6.90 |
| 6. | ජීවිත රක්ෂණ | සංඛ්‍යාව | 19,365 | 21,931 | 18,214 | 18,185 | 686 | 1,433 | 584 | 1,157 | 3.54 | 6.53 | 3.21 | 6.36 |

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

-------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදයට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 අප්‍රේල් 10 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

---------------------

මණ්ඩලය විසින් 2014 - 2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව 2013 වර්ෂය සඳහා එය යාවත්කාලීන කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

**---------------------------------**

2013 වර්ෂය සඳහා අයවැයගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී අභ්‍යන්තර පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බැව් නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

**---------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඇ) වාහන උපයෝජනය
(ඈ) අයවැය
(ඉ) කාර්ය මණ්ඩල කළමනාකරණය
(ඊ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**

**විගණකාධිපති (වැඩබලන)**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. FB/E/FPS/1/13/03    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 26 February 2015

The Chairman,
Agricultural and Agrarian Insurance Board

**Report of the Auditor General on the Financial Statements of the Farmer's Pension and Social Security Benefit Scheme for the year ended 31 December 2013 in terms of Section 14(2)(c) of the Finance Act, No. 38 of 1971**

---

Reference to my letter of even number dated 28 December 2014 on the above subject.

02. The above mentioned report is sent herewith.

W.P.C. Wickramaratne
Auditor General (Acting)

Copy to : Secretary, Ministry of Finance

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34  +94-11-2887223  oaggov@sltnet.lk  www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/ ඊ/එෆ්පීඑස් /1/13/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 28 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2013 සැප්තැම්බර් 29 දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

---

යෝජනා ක්‍රමයේ සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 53,968.5 ක සෘණාත්මක විශ්‍රාම අරමුදල් ගිණුම් ශේෂයක් පැවතුණි. යෝජනා ක්‍රමයේ සාමාජිකයන්ගෙන් ප්‍රමාණවත් දායකයක් රැස්කර ගැනීම වෙනුවට මණ්ඩලයේ පවත්නා වෙනත් අරමුදල්වලින් ණය ලබාගැනීම මඟින් විශ්‍රාම ගෙවීම් සිදුකිරීම හේතුවෙන් 2009 වර්ෂයේදී රු.මිලියන 663.8 ක් වූ ධන ශේෂය සමඟ සැසඳීමේදී 2010 වර්ෂයේ සිට එය සෘණ ශේෂයක් ලෙස අඛණ්ඩව වැඩිවී තිබුණි. මහා භාණ්ඩාගාරයේ සහ වෙනත් අරමුදල්වල මූල්‍ය සහායන් නොමැතිව යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හැකියාව සැකසහිතය. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 4 ක කාල පරිච්ඡේදය සඳහා යෝජනා ක්‍රමයේ අරමුදල් ගිණුමේ ශේෂය පහත දැක්වේ.

| වර්ෂය | අරමුදල් ගිණුමේ ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 2013 | (53,968.5) |
| 2012 | (48,945.1) |
| 2011 | (44,154.2) |
| 2010 | (40,536.7) |
| 2009 | 663.8 |

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (ශ්‍රීලංගිප්‍ර)

---

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව විශ්‍රාම වගකීම සඳහා ආයුගණක තක්සේරුව 2007 වර්ෂයේදී සිදුකර තිබූ අතර ඉන්පසු විශ්‍රාම වගකීම සඳහා ආයුගණක තක්සේරුවක් සිදුකර නොතිබුණි. තවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ට අනුව, නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ආයුගණක තක්සේරුව සිදුකර ගිණුම්ගත කර නොතිබූ අතර නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ වගකීම ඉටුකිරීම සඳහා සේවාදායක විසින් දායකය ආයෝජනය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) වැඩ තහනම් කරන ලද සේවකයකු වෙනුවෙන් 2012 වර්ෂයේ සිට පාරිතෝෂික ප්‍රතිපාදන කර නොතිබූ හෙයින්, පාරිතෝෂික වගකීම රු.280,170 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සාවද්‍යාව ගණනය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.2,244,279 ක් වූ තොග වටිනාකම රු.197,990 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂය තුළදී අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ගොවීන්ට ගෙවන ලද රු.7,305,897 ක් වූ විශ්‍රාම වැටුප් 2013 දෙසැම්බර් 31 අවසානය දක්වා විශ්‍රාම වැටුප් වගකීමෙන් අඩුකර නොතිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් වගකීම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2012 වර්ෂය සඳහා තැපැල් කාර්යාලවලට ගෙවන ලද රු.6,148,860 ක් වූ කොමිස් මුදල, කොමිස් මුදල් ලෙස වෙනම ගිණුම් ගත කිරීම වෙනුවට විශ්‍රාම වැටුප් වගකීමෙන් අඩුකර තිබුණි. එබැවින් එම වගකීම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) අදාළ ණයගැතියන් විසින් සනාථ කරන ලද රු.74,918 ක් වූ ලැබිය යුතු ආදායම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු.6,546,279 ක් වූ ලැබිය යුතු මුළු ආදායම් ශේෂ එකතුවෙන් රු.3,356,891 ක් එනම් සියයට 51.27 ක් පමණක් අදාල පාර්ශවයන් විසින් සනාථ කර තිබුණි.

(ආ) එකතුව රු.2,632,031 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු නිරවුල් කිරීමෙන් තොරව 1997 වර්ෂයේ සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී විශ්‍රාම වගකීම ගෙවීම සඳහා ලබාගන්නා ලද කෙටි කාලීන ණය හා ඒ සඳහා ගෙවිය යුතු පොලී රු.934,123,40 ලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමෙන් තොරව ගිණුම්වල පැවතුණි.

(ඈ) ලැබිය යුතු ආදායම් රු.714,497 ක් 2006 වර්ෂයේ සිට අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල පැවතුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.5,026,459,340 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,670,653,340 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.355,806,000 කින් එනම් සියයට 7 කින් තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

ඉහත පිරිහීම සඳහා හේතු වූ ප්‍රධාන කරුණු පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂයේ අනුරූපී ආදායම හා දායකය සමඟ සැසඳීමේදී පොලී ආදායම හා ගොවීන්ගේ දායකය පිළිවෙලින් සියයට 31 කින් හා සියයට 35 කින් අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සමූහ රක්ෂණ වාරික වියදම, ලැබුණු ජීවිත රක්ෂණ වාරික ආදායම හා ගොවීන්ගෙන් ලද මුළු දායකත්වය සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 815 ක් හා සියයට 800.3 ක් විය. තවද ගොවීන් තථ්‍ය සංඛ්‍යාව සැලකීමෙන් තොරව සාමාන්‍ය ගොවීන් සංඛ්‍යාව පදනම් කරගෙන සමූහ රක්ෂණ වාරික ගෙවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 ප්‍රකාරව 2007 වර්ෂයේදී සිදුකරන ලද ආයුගණක තක්සේරුව පදනම්ව ශේෂ පත්‍ර දිනට ගොවීන්ගේ විශ්‍රාම වගකීම රු.71,362,000 කින් වැඩිවී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-------------------------------------**

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ කැපීපෙනෙන තත්ත්වයන් පහත වගුවෙන් දැක්වේ.

| | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** |
| මුළු ආදායම | 40,104 | 61,148 | 115,434 | 170,898 | 306,607 |
| මුළු වියදම | (1,847,921) | (1,587,686) | (1,402,379) | (1,195,110) | (1,103,779) |
| විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම | (3,288,353) | (3,216,991) | (3,059,459) | (2,938,033) | - |
| රජයේ ප්‍රදානයට පෙර වර්ෂය සඳහා ඌනතාවය | (5,096,170) | (4,743,529) | (4,346,404) | (3,962,245) | (797,172) |
| රජයේ ප්‍රදාන | 69,000 | 71,555 | 727,605 | 39,500 | 55,860 |
| රජයේ ප්‍රදාන ක්‍රම ක්ෂය | 711 | 1,321 | 1,228 | 1,477 | - |
| රජයේ ප්‍රදානවලින් පසු ඌනතාවය | 5,026,459 | (4,670,653) | (3,617,571) | (3,921,268) | (741,312) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2009 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ ආදායම සියයට 87 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර එම කාල පරිච්ඡේදය තුළ මුළු වියදම සියයට 67 කින් වැඩිවී තිබුණි.

(ii) නියමිත කොන්දේසිවලට විශ්‍රාම වැටුප් බැරකම තහවුරු කිරීම හා වියදම වැඩිවීම හේතුවෙන් 2009 සිට 2013 කාල පරිඡේදය තුළදී රජයේ ප්‍රදානයට පෙර ශුද්ධ අතිරික්තය සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**4.1 කාර්ය සාධනය**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 තුළදී යෝජනා ක්‍රමය සඳහා ගොවීන්ගෙන් එකතු කර ගන්නා ලද මුළු දායකයන් හා විශ්‍රාම වැටුප් ගෙවීම් පහත දැක්වේ.

| වර්ෂය | දායකය | විශ්‍රාම වියදම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2013 | 32.1 | 1,646.98 |
| 2012 | 49.6 | 1,380.7 |
| 2011 | 97.6 | 1,226.7 |
| 2010 | 136.7 | 1,044.7 |
| 2009 | 148.7 | 955.6 |

පසුගිය වර්ෂ පහ සඳහා විශ්‍රාම ගෙවීම අඛණ්ඩව සීඝ්‍රයෙන් වැඩිවී තිබුණු අතර, යෝජනා ක්‍රමයට ගොවින් බඳවා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ලැබුණු දායකය ක්‍රමයෙන් අඩුවී තිබුණි.

(ආ) දෙවැනි හා පසු වාරික අයවැයගත මුදල වන රු.122,666,000 කින් සමාලෝචිත වර්ෂය තුළදී රු.38,229,878 ක් එනම් සියයට 31 ක් පමණක් රැස්කර ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී යෝජනා ක්‍රමයට එක් ගොවියකු හෝ බඳවා ගෙන නොතිබුණි.

(ඈ) යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය අහිමි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී දායකයන් 81 දෙනෙකුට රු.3,318,494 ක මුදලක් ආපසු ගෙවා තිබුණි.

(ඉ) 2008 වර්ෂයේ සිට ආයෝජන හා ඒ මත පොලී පහත දැක්වෙන පරිදි සීඝ්‍රයෙන් අඩුවී තිබුණි.

| වර්ෂය | ආයෝජන | පොලී ආදායම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2013 | 14.5 | 1.9 |
| 2012 | 12.4 | 2.7 |
| 2011 | 30.7 | 1.6 |
| 2010 | 3.5 | 14.9 |
| 2009 | 582.2 | 138.9 |
| 2008 | 1,256.1 | 243.9 |

ඉහත තොරතුරු අනුව , ආයෝජන 2008 වර්ෂයේ රු.මිලියන 1,256.1 සිට 2013 වර්ෂයේ රු.මිලියන 14.5 ක් දක්වා එනම් සියයට 99 කින් අඩුවී තිබූ අතර පොලී ආදායමද 2008 වර්ෂයේ රු.මිලියන 243.9 සිට 2013 වර්ෂයේ රු.මිලියන 1.9 දක්වා එනම් සියයට 99 කින් අඩුවී තිබුණි.

## 4.2 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

---------------------------------------

1992 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන රු.1,179,624 ක් වටිනාකම වූ උපලබ්ධි නොවූ චෙක්පත් 117 ක් සම්බන්ධයෙන්, යෝජනා ක්‍රමය විධිමත් පියවර ගෙන නොතිබුණි.

## 4.3 ව්‍යාපෘති ප්‍රමාදයන්

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ දායකයන්ගේ පුද්ගලික ගිණුම් පරිගණක ගත කිරීම සඳහා 1987 වර්ෂයේ සිට රු.මිලියන 21.5 ක මුදලක් ගෙවා තිබුණද, එම ගිණුම් වර්ෂ 25 ක් ඉකුත් වීමෙන් පසුව 2013 දෙසැම්බර් 31 වන විටත් පරිගණක ගත කර යාවත්කාලීන කර නොතිබුණි. තවද යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම සඳහා දායකයන් සුදුසුකම් ලැබීම පිළිබඳව තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු යෝජනා ක්‍රමය මඟින් පවත්වා නොතිබුණි. එසේම දිස්ත්‍රික් කාර්යාල මඟින්ද දායක ගිණුම් යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) යෝජනා ක්‍රමය සඳහා නව පරිගණකගත පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා 2008 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වා ඒ පිළිබඳ දරන ලද වියදම රු.5,479,120 ක් විය. ගිවිසුමට අනුව, මාස 6 ක් ඇතුළත ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය සම්පූර්ණ කර නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රු.2,791,679 ක් වටිනාකම වූ චෙක්පත් 48 ක් සහ රු.7,152,249 ක් වටිනාකම වූ බැංකු අණකර 2008 වර්ෂයේදී යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු හා එක් සහකාර අධ්‍යක්ෂවරයකු විසින් සාවද්‍යාව පරිහරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබූ අතර මෙතෙක් එය නිරවුල් වී නොතිබුණි.

(ආ) රු.369,590 ක විශ්‍රාම මුදලක් සාවද්‍යව පරිහරණය කරන ලද ක්ෂේත්‍ර නිලධාරියකුට එරෙහිව නඩු පවරන ලද අතර සමාලෝචිත වර්ෂයේදී සේවයෙන් අස්කර තිබුණි. රු.100,000 ක මුදලක් පමණක් ඔහුගෙන් අයකර ගෙන තිබුණු අතර නඩුව අවසන් කර තිබුණි. එබැවින් ඉතිරි මුදල වන රු.269,590 ක් අයකර ගත නොහැකි වූ අතර ගිණුම්වල අවශ්‍ය ගැලපීම් 2013 දෙසැම්බර් 31 අවසානය දක්වා සිදුකර නොතිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

----------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී මාස 02 ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 අප්‍රේල් 10 දිනදීය.

**5.2 සංයුක්ත සැලැස්ම**

--------------------

2014 - 2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කර තිබුණද, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව එය 2013 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

ආදායම් හා වියදම් පිළිබඳ අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) දායක ගිණුම් පිළිබඳ පාලනය

(ඇ) විශ්‍රාම ගෙවීම්

(ඈ) අයවැය

(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. FB/E/FISH/1/13/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 31 March 2015

The Chairman,
Agricultural and Agrarian Insurance Board

**Report of the Auditor General on the Financial Statements of the Fishermen's Pension and Social Security Benefit Scheme for the year ended 31 December 2013 in terms of Section 14(2)(c) of the Finance Act, No. 38 of 1971**

Reference to my letter of even number dated 28 December 2014 on the above subject.

02. The above mentioned report is sent herewith.

W.P.C. Wickramaratne
Auditor General (Acting)

Copy to : Secretary, Ministry of Finance

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/ඊ/එෆ්අයිඑස්එච්/ 01/13/02

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 28 දින

සභාපති,

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනතේ 28(4) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2014 සැප්තැම්බර් 02 දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂය තුළදී විශ්‍රාම වැටුප් වගකීම තක්සේරු කර යළි ස්ථාපිත කර තිබුණු අතර ඒ සඳහා කරන ලද ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂ සඳහාද ආදායමට අයකර තිබුණි. එබැවින් අදාළ වර්ෂයන්හි මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි එය අයහපත් ලෙස බලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2013 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වය රු.1,691,656,081 ක් විය. ඒ

අනුව ඉදිරි වර්ෂයන් සඳහාද මෙම ප්‍රතිපාදනය වැඩිවීමට හැකියාවක් ඇති අතර එය යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව විශ්‍රාම වැටුප් වගකීම පිළිබඳ ආයු ගණක තක්සේරුව 2007 වර්ෂයේදී සිදුකර තිබූ අතර ඉන් පසු විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුවක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද 2007 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ දායකයින් සංඛ්‍යාව 54,248 සිට 68,560 දක්වා සියයට 26 කින් වැඩිවී තිබුණු අතර එසේම එම කාල පරිච්ඡේදය තුළම වගකීම රු.මිලියන 1,242 සිට රු.මිලියන 2,344 දක්වා සියයට 88 කින් වැඩි වී තිබුණි. තවද ඉහත ප්‍රමිතිය ප්‍රකාරව ආයු ගණක තක්සේරුව හා ගිණුම් තැබීම නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා සිදුකර නොතිබුණු අතර නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ වගකීම පැවරීම වෙනුවෙන් සේවාදායක විසින් දායක මුදල් ආයෝජනය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

2012 වර්ෂය සඳහා පරිපාලන වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තුවකින් ලැබිය යුතු රු.1,500,000 ක මුදලක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය දක්වා ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලබාදී තිබූ රු.මිලියන 639 ක (ණය සහ පොලී ) මුදලක් අයකර ගැනීමෙන් තොරව ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) එකතුව රු.1,059,025 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු 1998 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි.

### 2.2.5 පොලී ආදායම හඳුනා ගැනීම

ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලබාදී තිබූ අරමුදල් මත සමාලෝචිත වර්ෂයේදී රු.50,360,350 ක මුදලක් පොලී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද අරමුදල් මත පොලී ගෙවීම සම්බන්ධයෙන් මෙම යෝජනා ක්‍රම දෙක

අතර ගිවිසුමක් නොතිබුණි. තවද මෙම පොලී ආදායම සමාලෝචිත වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 91.15 ක් නියෝජනය විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත | |
| (i) 20 වගන්තිය | උපදේශක කමිටුව නිල බලයෙන් සාමාජිකයන් 06 දෙනෙකු හා නම් කළ සාමාජිකයන් 06 දෙනෙකු ඇතුළත්ව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද , 2013 වර්ෂය තුළදී සාමාජිකයන් 07 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |
| (ii) 26 වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැර හැරි සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| 9 පරිච්ඡේදයේ 7 ඡේදය | මහා භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිලධාරින් කිහිපදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.395,928 ක් වූ විශේෂ දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය ප්‍රකාශන

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.182,738,623 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.154,693,176 ක් වූයෙන් රු.28,045,447 කින් එනම් සියයට 18 කින් මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

ඉහත පිරිහීමට හේතුවූ ප්‍රධාන කරුණු පහත දැක්වේ.

(අ) පොලී ආදායම හා ධීවර දායක මුදල් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.7,466,880 කින් හෙවත් සියයට 12.48 කින් හා රු.537,646 කින් හෙවත් සියයට 15.62 කින් අඩුවී තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් ගෙවීම හා විශ්‍රාම වගකීම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.7,870,966 කින් හෙවත් සියයට 26.68 කින් හා රු.13,719,819 කින් හෙවත් සියයට 7.57 කින් වැඩිවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ අවධානයන් පහත වගුවේ දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | විචලනය |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | **රු.** | **රු.** | **%** |
| පොලී ආදායම | 52,346,551 | 59,813,431 | 12.48 |
| ධීවරයින්ගේ දායකය | 2,904,746 | 3,442,392 | (15.62) |
| පුනරාවර්තන වියදම සඳහා ප්‍රදාන | 1,500,000 | - | - |
| මුළු ආදායම | 56,751,297 | 63,255,823 | (10.28) |
| <u>**අඩුකළා :- වියදම්**</u> | | | |
| විශ්‍රාම ගෙවීම් | (37,367,889) | (29,496,923) | (26.68) |
| වෙනත් මෙහෙයුම් වියදම | (3,226,101) | (3,091,878) | (4.34) |
| විශ්‍රාම වගකීම වැඩිවීම | (194,932,819) | (181,213,000) | (7.57) |
| පරිපාලන හා මූල්‍ය වියදම් | (3,963,111) | (4,147,199) | 4.44 |

| | | | |
|---|---|---|---|
| මුළු වියදම් | (239,489,920) | (217,949,000) | (9.88) |
| වර්ෂය සඳහා සමස්ත ඌනතාවය | (182,738,623) | (154,693,177) | (18.13) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම යෝජනා ක්‍රමයේ මුළු දායකය රු.1,213,086 ක් වුවද සමාලෝචිත වර්ෂය සඳහා මුළු විශ්‍රාම වැටුප් ගෙවීම රු.37,367,889 ක් විය. එබැවින් විශ්‍රාම වැටුප් ගෙවීම සියයට 3,083 කින් ලැබුණු දායකය ඉක්මවා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රු.28,045,447 කින් සමස්ත ඌනතාවය වැඩිවීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ අරමුදල් ගිණුමේ ශේෂය රු.මිලියන 28.03 ක් හෙවත් සියයට 18.13 දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්ය සාධනය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී යෝජනා ක්‍රමයට නව දායකයින් බඳවා ගැනීම සඳහා ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී දායකයින් 1,700 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණද, බඳවා ගත් තථ්‍ය දායකයින් සංඛ්‍යාව 476 පමණක් වූ අතර සියයට 38 ක ඉටුකර ගැනීමක් පමණක් එයින් දැක්වුණි. දිස්ත්‍රික්ක හතක එක් දායකයෙක් හෝ බඳවා ගෙන නොතිබු බවද නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා සාමාජිකයන්ගෙන් රු.3,540,000 ක දායක මුදල් ලබාගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද ලැබුණු තථ්‍ය දායක මුදල් රු.2,169,418 ක් පමණක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දායකයින් 39,900 ක ගෙන් ඉලක්කගත දෙවැනි සහ පසු වාරික එකතු කිරීම රු.5,985,000 ක් වුවද, දායකයින් 1,129 ක ගෙන් තථ්‍ය එකතු කිරීම රු.849,599 ක් හෙවත් සියයට 14.19 ක් පමණක් විය.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

සාමාජිකත්වය අහිමි කරන ලද දායකයින් හඳුනා ගැනීමට හා හිඟ වාරික ඔවුන්ගෙන් අයකර ගැනීමට යෝජනා ක්‍රමය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය**

**-------------------------------------------**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

**---------------------------------------------**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදයට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන්වී මාස 02 ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 අප්‍රේල් 10 දිනදීය.

**6. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අරමුණු ඉටුකර ගැනීම.

(ආ) ධීවරයින්ට ප්‍රතිලාභ ගෙවීම

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්

(ඈ) වාරික අයකර ගැනීම

(ඉ) උපදේශක කමිටුවල ක්‍රියාකාරිත්වය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 2013/4/5/මූ/ර/2
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ..............
දිනය / திகதி / Date } 2014.10.20

විගණන අධිකාරි,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**2013 වර්ෂයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.**

2013 වර්ෂයේ කෘෂි රක්ෂණයෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

..........................
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephones | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812571<br>011-2812572<br>011-2812573 | 011-5732397<br>011-2812574 | 011-5384000 |

**කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 විගණන මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

**(අ)** සේවක ණය ලැබිය යුතු ගිණුම් ශේෂයන් යටතේ මූල්‍ය වත්කමක් ලෙස ගිණුම් ගත කර ඇති අතර එයට අදාල ගිණුම් ප්‍රතිපත්තිය සටහන් අංක 02.4 යටතේ හෙළිදරව් කර ඇත.

**(ආ)**මණ්ඩලයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිත සඳහා අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය වාර්තාවල පෙන්නුම් කර ඇත. ඔවුන්ගේ සත්‍ය වැටුප පදනම් කර ගෙන අනාගත වගකීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත. එම වගකීම් පිළිබඳව ආයුගණක තක්සේරුවක් ඉදිරියේදී ලබා දීමට කටයුතු සිදු කරනු ලැබේ.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** අවසන් ගිණුම් පිලියෙල කරන දින දක්වා හඳුනා ගත් සියළු ආදායම් ලැබිය යුතු රක්ෂණ වාරික ලෙස හඳුනා ගෙන ඇත. ඉන්පසු ලැබූ ආදායම් ඊලඟ ගිණුම් වර්ෂය වෙනුවෙන් ගිණුම් ගත කර ඇත. 2014 වර්ෂය වෙනුවෙන් ගිණුම් ගත වන ආදායමට අදාල කොමිස් මුදල එම වර්ෂයේදී එම වර්ෂයට අදාලව ගිණුම් ගත කර ඇත.

**(ආ)**ඉදිරි ගිණුම් වර්ෂයේදී කාල පරිච්ඡේදයට අදාල ආදායම් නිවැරදිව හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**(ඇ)**අවසන් ගිණුම් පිලියෙල කරන දින දක්වා වාර්තා වූ, හඳුනා ගත හැකි වූ සියළු වියදම් උපචිත පදනම යටතේ ගිණුම් ගත කර ඇත. පසුව හඳුනා ගනු ලබන වියදම් 2014 වර්ෂය සඳහා ගිණුම් ගත කර ඇත.

**(ඈ)**අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය වෙත භාරදී ඇති පැරණි වත්කම් සම්බන්ධයෙන් එමඅමාත්‍යංශය සමඟ සාකච්ඡා කොට මුදල් අය කර ගැනීමට හෝ එම භාණ්ඩ නැවත මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(ඉ)** මණ්ඩලයේ සේවක ණය හා අත්තිකාරම් ගිණුමේ ශේෂය මිලියන 36,666,009.00 කි. එම ශේෂයට සාපේක්ෂව බොල්ණය සඳහා 2,008,295.00 ක් ගිණුම් ගත කර ඇත.මෙය මුළු ණයගැතියන්ගේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 5.4% කි. වෙන් කල බොල්ණය ප්‍රමාණයේ හා ණය ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය පිලිබඳව නිවැරදි තක්සේරුවක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**(ඊ)** ගොවි භාරකාර අරමුදලෙහි ණය ගිණුමට ගිණුම් ගත කර ඇති පොලිය ඉන් ඉවත් කර ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**(උ)** ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අනුව ලබා දුන් ණය මුදලේ පොලිය ජීවිත රක්ෂණ අරමුදල තුල ගිණුම් ගත කර ඇත.

### 2.2.3 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

- අවසන් ගිණුම් අනුව දක්වා ඇති ආදායම නිවැරදි වන අතර වර්ෂය තුල මෙම ආදායමට අදාල මුදල් ගිණුම් ගත වී ඇත. අවසන් ගිණුම් පිලියෙල කිරීමේදී ඉදිරි කාල පරිච්ඡේදයන් සඳහා ලද රක්ෂණ වාරික සඳහා ගැලපුම් සිදු කරන බැවින් මෙහෙයුම් අංශයේ ආදායමට සමාන කල නොහැක. කෙසේ වෙතත් අවසාන ගිණුම් අනුව ආදායම හා මෙහෙයුම් අංශය හැකිතාක් දුරට සංසන්දනය කිරීමට කටයුතු කරනු ලැබේ.

- අවසන් ගිණුම් පිලියෙල කරන අවස්ථා වන විට 2013/2014 මහ කන්නයේ වී හා අතිරේක බෝග වගාවන් වෙනුවෙන් හානි වාර්තා වෙමින් පැවති අතර ඒ වෙනුවෙන් වෙන් කිරීම් සිදු කර ඇත. රක්ෂණ අංශය මඟින් ලබා දී ඇත්තේ පසුගිය කන්න වෙනුවෙන් මේ වන විට ගෙවීම් කර ඇති වියදමක් බැවින් එම අංශ දෙකේහි වාර්තා පදනම් දෙකක් යටතේ පිළියෙල වී ඇත. (උපචිත හා මුදල්) එබැවින් මෙම වාර්තා මෙලෙස සංසන්දනය කිරීම ප්‍රායෝගික නොවේ.

### 2.2.4 <u>ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම</u>

**(අ)** <u>අය නොවන ණය හා අත්තිකාරම් අයකර ගැනීම සඳහා පහත පියවර ගෙන ඇත</u>

- 2014 වර්ෂය තුල ණයකරුවන් දෙදෙනෙකු ණය පියවීම් කර ඇති අතර ණයකරුවන් හතර දෙනෙකුගේ ණය මුදල් ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත.

- ණය කරුවන් හය දෙනෙකුගෙන් ණය මුදල් අය කර ගැනීම සඳහා ඔවුන්ට හා ඔවුන්ගේ ඇපකරුවන් වෙත එන්තරවාසි යවා ඇත.

- ඉතිරි ණයකරුවන්ගෙන් ණය මුදල් අය කර ගැනීම සඳහා ඔවුන් පදිංචි දිස්ත්‍රික්කවල සහකාර අධ්‍යක්ෂවරු මගින් ඔවුන් හමු වී සාකච්ඡා කොට ණය ගෙවීම සඳහා පොළඹවා ගැනීමට කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස උපදෙස් දී ලිපි යවා ඇත.

**(ආ)**මියගිය සේවකයින්ගෙන් මණ්ඩලයට අයවිය යුතු ණය හා අත්තිකාරම් පාරිතෝෂිකයෙන් අයකර ගෙන අදාළ පියවීම් සිදු කිරීම පිණිස අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් 2012.12.28 දිනැතිව අනුමැතිය ඉල්ලා ඇත. මියගිය සේවකයින්ගේ හිඟ ණය හා අත්තිකාරම් හිලවු කිරීමෙන් පසු ඉතිරියක් වේ නම් ඔවුන්ගේ කලත්‍රයන් වෙත ඉතිරි මුදල් ලබා දිමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)**ලබා ගත් ණය මුදල් ක්‍රමිකව ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**(ඇ)**මෙම මුදල් ක්‍රමිකව එම ආයතනය වෙත ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**(ඉ)** අදාල වැටුප් ප්‍රතිපූර්ණය කරන ලෙස අදාල අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර ප්‍රතිපූර්ණය නොකරන ලද වැටුප ගිණුම් වාර්තාවල පෙන්වීමට කටයුතු කර ඇත.

## 2.3 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

**(අ) <u>පරිපාලන සේවා චක්‍රලේඛ</u>**

**<u>(I) හා (II) 2006.09.22 දිනැති පරිපාලන සේවා චක්‍රලේඛ 30 හා 30(I) (II)</u>**

උසස් වීම් ලබාදීමේදි හා වැටුප් පරිවර්තනය කිරීමේදී සිදුවී ඇති වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

**(ආ) (I) <u>මුදල් රෙගුලාසි 371 ( ඒ)</u>**

වන්දි ගෙවීම් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් දිස්ත්‍රික්කයන්ට ගොස් අකණ්ඩව වන්දි ගණනය කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. මෙලෙස දිස්ත්‍රික්කයට අදාල වන්දි ගණනය කිරීම් එකවර නිම කරනු ලබන අතර රාත්‍රි කාලයේදී පවරන රාජකාරී සිදු කරනු ලබයි. එවැනි රාජකාරීවලදී අවශ්‍ය වියදම් දැරීම සඳහා අවශ්‍ය අත්තිකාරම් මුදල් එම කර්තව්‍ය භාරව යන නිලධාරියා ලබා ගනු ලැබේ.මුදල් පියවීම ප්‍රමාද වන සෑම අවස්ථාවකම ලඟ තබා ගෙන සිටි මුදල වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර ඇති අතර ලබා ගන්නා අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරමක් ලබා නොදීමට කටයුතු සිදු කරනු ලැබේ.

**<u>(II) (III) මුදල් රෙගුලාසි 363 (ඒ) (IV) ,751 හා මුදල් රෙගුලාසි 454</u>**

මේ වන විටත් අංශ අනුව තොග ලේඛන පවත්වා ගනු ලබන අතර එම තොග ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අංශ ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දුන් අතර, ගබඩා තොග ලේඛනයේ ඇතුළත්ව නොතිබූ අයිතමයන් මේ වන විට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

**3. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3.1.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

**3.1.2 <u>මූල්‍ය තත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය</u>**

**4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**4.1 <u>කාර්යසාධනය</u>**

**<u>රක්ෂණ යෝජනා ක්‍රම පරිපාලනය</u>**

**(අ), (ආ), (ඇ)**

කෘෂිකාර්මික වගාවන් හා ඊට අනුගාමීව ක්‍රියාත්මක වෙනත් ව්‍යාපෘතීන් හි ස්ථිරභාවය සඳහා ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කරන රාජ්‍ය ආයතනයක් වශයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය තෝරාගත් ව්‍යාපෘතීන් කිහිපයක් වෙනුවෙන් සැලසුම් සකස් කොට 2013 වසරේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. එම කාලය තුළදී මණ්ඩලයට මුහුණ පෑමට සිදුවූ මූල්‍ය හා අනෙකුත් දුෂ්කරතාවයන් හේතු කොටගෙන මණ්ඩලය අපේක්ෂා කළ නියමිත ඉලක්ක කරා මෙම වසර තුළදී ලඟා වීමට නොහැකි වුණි. මේ සඳහා විවිධ හේතූන් බලපාන ලද අතර, මණ්ඩලය මඟින් උපරිම ශක්තිය යොදවමින් මිලියන 93.8 පමණ පමණ ආදායමක් උපයා ගැනීමට 2013 වසරේදී සමත්වී ඇත.

මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කළ ආකර්ෂණීයම යෝජනා ක්‍රමයක් වූ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුදල හීනවීම නිසා 2012 වසර මැද සිට විශ්‍රාම වැටුප් ලබාදීම නතර වුණි. ලැබෙන ආදායම් මඟින් කඩින් කඩ එතෙක් විශ්‍රාම වැටුප් ලබමින් සිටි දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමක් සිදු කළද, අලුතින් විශ්‍රාම වැටුප් ලබා ගැනීමට සුදුසුකම්ලත් දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමක් සිදු නොවුණි. 2013 වසරේ සිට සියළුම විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු නතර විය. මෙම තත්වය මණ්ඩලය කෙරේ ඉතාමත්ම අහිතකර අන්දමින් බලපාන ලද අතර, මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන කිසිදු යෝජනා ක්‍රමයක් කෙරෙහි ගොවි ජනතාවගේ කිසිදු විශ්වාසයක් නොවුණි. ප්‍රවර්ධන වැඩසටහන් වලට සහභාගි වූ ගොවිජනතාව ප්‍රකාශ කර සිටියේ නතර වී ඇති ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ වැටුප් ගෙවීම් කටයුතු නැවත ආරම්භ කරන තුරු වෙනත් යෝජනා ක්‍රම සඳහා ද දායක වීම සිදු නොකරන බවය. ඒ අනුව, මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලද සියළුම යෝජනා ක්‍රමයන්හි භෞතික හා මූල්‍ය යන අංශ දෙකෙහිම ප්‍රගතිය අඩු වූ අතර , එය 2012 වසර හා සසඳන කළ විශාල අඩුවීමක් විය.

සීමිත නිලධාරීන් පිරිසක් සිටින කෘෂි රක්ෂණ මණ්ඩලය තම යෝජනා ක්‍රම ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කිරීමේදී කෘෂිකර්මාන්තය හා සම්බන්ධව ක්‍රියාත්මක කරන අනෙකුත් සහෝදර ආයතන වල සහායද උපරිම අයුරින් ලබා ගන්නා ලදි. ඒ අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාල, ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාල, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමෘද්ධි අධිකාරිය සහ මහවැලි අධිකාරිය වැනි රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල සහ අධිකාරි වැනි ආයතන සහ ප්‍රාදේශීය කාර්යාල වල සහයෝගය නොමඳව ලබා ගනිමින් අදාල සැලසුම් ක්‍රියාත්මක කරමින් නියමිත ඉලක්ක කරා ලඟා වීම සිදුකරන ලදී. විශේෂයෙන් එම ආයතන වලට අදාල ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල වල සහයෝගය උපරිම අන්දමින් ලබා ගන්නා ලදී. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ද මෙම ආයතන වල ක්ෂේත්‍ර මණ්ඩල වල සහය නොමඳව ලබා දුන් අතර, විශේෂයෙන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්, සමෘද්ධි නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරුන්, ඒකක

කළමණාකාරවරුන්, පශු වෛද්‍ය නිලධාරින් සහ සත්ව සංවර්ධන උපදේශකවරුන් වැනි ක්ෂේත්‍ර කටයුතු වලදී ගොවිජනතාව වෙතට ළඟින්ම සේවා ලබා දෙන නිලධාරින්ගේ සහය මේ සඳහා නොඅඩුව ලැබෙන අතර, ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම නතර වීම නිසා ඇති වූ අර්බුදයට මුහුණ දීමට ඔවුන්ට ද සිදු විය. ඒ අනුව, මණ්ඩලයට ඔවුන්ගේ සහය ලබා දීම ඔවුන් විසින් ප්‍රතික්ෂේප කළ අතර, එය ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවීමේදී අප ආයතනයට  මුහුණපෑමට සිදුවූ බලවත් අභියෝගයක් විය.

අප මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන සියළුම යෝජනා ක්‍රම ගොවි ජනතාව ඉලක්ක කරමින් සකස් කර ඇති බැවින්, ඔවුන්ගේ ආර්ථික තත්ත්වයද මෙම යෝජනා ක්‍රම ව්‍යාප්තිය සඳහා බලපායි. 2010/11 මහ කන්නයේ සිට දිගින් දිගටම දේශගුණික හා කාළගුණික විපර්යාසයන් හේතුකොට ගෙන ඔවුන්ගේ වගාවන් දිගින් දිගටම විනාශ විය. එමඟින් ගොවීන්ගේ ආදායම් තත්වයන් සීඝ්‍ර ලෙස පහත හෙලන ලදී. ඒ අනුව, අප මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන යෝජනා ක්‍රම සඳහා ගොවීන් නැඹුරු කර ගැනීමේ හැකියාව ද අල්ප විය.

ඉහත සඳහන් ව්‍යසනයන් හමුවේ, රජය විසින් 2013 වසර සඳහා සම්මත කර ගන්නා ලද අය වැය ලේඛණය මඟින් පොහොර සහනාධාරය ක්‍රියාත්මක සියළුම වගාවන් අනිවාර්ය රක්ෂණයකට ඇතුළත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, පොහොර 1kg කට රු. 3/- ක වාරික මුදලක් අය කර, රක්ෂණ ක්‍රමයක් ගොවීන් වෙත ලබා දුණි. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම රජයේ රක්ෂණ ආයතනය වශයෙන් අප මණ්ඩලය වෙත ලබා දිය යුතුව තිබුණද, රාජ්‍ය තීරණ මත එය ක්‍රියාත්මක කිරීමේ හා පවත්වා ගෙන යාමේ බලය “ **ජාතික රක්ෂණ භාර අරමුදල**” වෙත පවරණ ලදී. අප මණ්ඩලය මඟින් ක්‍රියාත්මක රක්ෂණ යෝජනා ක්‍රම අතරින් වැඩිම ආදායම් උපයා ගැනීම සිදු කෙරෙනුයේ වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් වන අතර, සියළුම කුඹුරු සඳහා පොහොර සහනාධාරය ලබා දුන් බැවින්, වගා කළ සියළුම කුඹුරු ඉහත රක්ෂණ යෝජනා ක්‍රමයට යටත් වුණි. ඒ අනුව, ආයතන දෙකකින් තම කුඹුරු රක්ෂණය කිරීම ගොවින් ප්‍රතික්ෂේප කළ බැවින්, වී වගා රක්ෂණයේදීද අපේක්ෂිත ඉලක්ක කරා ළඟා කර ගැනීමට නොහැකි විය.

කෙසේ වුවද , වගා ණය ලබා ගන්නා ගොවීන් පදනම් කර ගෙන වගාවන් රක්ෂණය කිරීමට කටයුතු කරන ලද අතර, 2010/11 මහ කන්නයේ සහ 2011 සහ 2012 වසර වලදී දේශගුණික හා කාළගුණික විපර්යාස මත සිදුවූ වගා හානි හේතුවෙන් ගොවීන් ලබා ගත් වගා ණය ආපසු නොගෙවීම මත ගොවීන් වෙත වගා ණය ලබා දීම සීමා වුණි. එයද රක්ෂණ ආදායම් පහළ යෑමට හේතු වුණි. කෙසේ වුවද, මණ්ඩලය මහත් පරිශ්‍රමයක්  යොදවමින් කිසියම් ප්‍රගතියක් වගා රක්ෂණ කටයුතු මඟින් ළඟා කර ගැනීමට සමත් වී ඇත.

ඉහත සඳහන් අහිතකර තත්වයන් ගේ බලපෑම නිසා වගා කිරිමට අපේක්ෂිත බිම් ප්‍රමාණ සියල්ල වගා කිරීමට නොහැකි වුණි. එම තත්වයද අදාල ඉලක්ක ලගා කර ගැනීමට අහිතකර අන්දමින් බලපා ඇත. වගා බිම් ප්‍රමාණය අඩුවීම හා හානි තත්ව පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ " **සමාජ ආර්ථික සහසැලසුම් ඒකකය** " මගින් නිකුත් කරන **"Crop Forecast"**නම් ප්‍රකාශනයෙන්ද මේ බව තහවුරු කර ඇත. මෙම හේතු මත ගොවීන්ගේ ආදායම් තත්ත්වය පහල ගිය අතර, එයද සියළුම රක්ෂණ යෝජනා ක්‍රම ව්‍යාප්තියේදී අහිතකර අන්දමින් බලපාන ලදි. ඒ අනුව 2012 වසරේදී ඉපයූ ආදායම ලබා ගැනීමට නොහැකි විය.

ස.ණ.ස. වැනි වෙනත් බාහිර ආයතන පශු රක්ෂණ කටයුතු සඳහා තරඟකාරී අන්දමින් පිවිසීම නිසා එම අංශයෙන් ද ප්‍රගතිය ලඟා කර කර ගැනීමට නොහැකි විය. සණස ආයතනය මඟින් ඉදිරිපත් කර තිබූ රක්ෂණ කොන්දේසි හා වාර මුදල් ප්‍රතිශත ඉතා ලිහිල් හා අඩු අගයක් විය. ඒ මඟින් ඉදිරිපත් කල වාරික මුදල් ප්‍රතිශතය පහල මට්ටමක් වූ අතර, එය සියළු බදු ඇතුලත්ව සතුන්ගේ වටිනාකමින් 35% සිට 46% තරම් අඩු මට්ටමක විය. මණ්ඩලය මුහුණ පා ඇති වත්මන් මූල්‍ය අර්බුද හමුවේ එතරම් අඩු ප්‍රතිශතයක් අය කිරීම ගැටළුවක්ව පැවතුණි. කෙසේ වුවද, මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා මණ්ඩලය මඟින් ද වාර මුදල් ප්‍රතිශෝධනයක් 2013/04/11 දින සිදු කරන ලදි. මෙම තරඟය හමුවේ තරඟ කිරීමට තරම් මෙම සංශෝධිත වාර මුදල් ප්‍රමාණවත් නොවූයෙන් නැවත වාර මුදල් මට්ටම් සංශෝධනයක් 2013/08/01 දින සිට ක්‍රියාත්මක කරන ලදි. මෙම කටයුතු වර්ධනය කර ගැනීම සඳහා 2013/08/01 සිට 2014/01/31 දක්වා අතර මාස 06 ක කාලය තුල විශේෂ අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, මුලතිව් දිස්ත්‍රික්කයේ හැර අනෙකුත් දිස්ත්‍රික්කයන් හි පශු රක්ෂණ කටයුතු වල යම් ප්‍රගතියක් දැකිය හැකිය. එම ප්‍රවර්ධන වැඩසටහනේදී භෞතික ප්‍රගතිය 3,560 ක් වන අතර, 2012 වසරේදී 2012 අගෝස්තු සිට 2013 ජනවාරි දක්වා ප්‍රගතිය වූ 2686 ( ගව 1693 + එළු 921 + වැස්සි පැටවු 72) සමඟ සැසඳීමේදී 33% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එම වාර්තාවන් අනුව අදාල ප්‍රවර්ධන කාලය සඳහා 2012 වසරට වඩා ගව රක්ෂණයෙන් 68% ක ප්‍රගතියක් ලගා කර ගෙන ඇත. එළුවන් හා වැස්සි පැටවුන් රක්ෂණයේ ප්‍රගතියේ අඩුවක් පෙන්නුම් කල ද එම යෝජනා ක්‍රම ක්‍රියාත්මක වනුයේ රජයේ සහනාධාර මත බෙදා දෙනු ලබන සතුන් සඳහා පමණක් වන බැවින්, රජය මගින් බෙදා දෙනු ලබන සතුන්ගේ සංඛ්‍යාව මත එළු හා වැස්සි පැටවුන් රක්ෂණ යෝජනා ක්‍රම වල ප්‍රගතිය රඳා පවතී. මෙම වසරේදී එබඳු යෝජනා ක්‍රම අඩු වීම මත එම යෝජනා ක්‍රම වල ප්‍රගතිය පෙර වසරට වඩා අඩුවී ඇති බව පෙනේ. කෙසේ වුවද 2012 වසර හා සැසඳීමේදී (ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වූ කාලය තුල) 2012 වසරේදී ගව රක්ෂණයේ ආදායම රු. 5,440,471/- (රු. 5,415,071/- + රු. 25,400/-) වූ අතර, 2013 ප්‍රවර්ධන වැඩසටහනට අදාලව මූල්‍ය ප්‍රගතිය රු. 5,329,113/-( රු. 5,325,293/- + රු. 3,820/) කි. එය 2012 වසර සමඟ සැසඳීමේදී රු. 111,358/- ක අඩුවක් පෙන්නුම් කරයි. අය කරන වාරික මුදල් ප්‍රතිශතය අඩු කිරීම නිසා මෙවැනි

තත්ත්වයක් පෙන්නුම් කරන අතර, ඉලක්ක සකස් කිරීමේදී කලින් තිබූ ඉහල වාරික මුදල් ප්‍රතිශතයට අනුව, මූල්‍ය ඉලක්ක සකස් කර තිබීම ඊට බලපා ඇත.

ඉහත සඳහන් කල සියළු කරුණු මෙම රක්ෂණ ප්‍රගතිය නොමැති වීමට බලපා ඇති බව කිව යුතුය. මල් පැල රක්ෂණය සුළු පරිමාණ මල් වගාකරුවන් සඳහා ක්‍රියාත්මක කල අතර, මල් වගාව සුළු වශයෙන් කිරීමේදී ඊට සිදු වන හානි අවම වන නිසා එම වගාකරුවන් රක්ෂණය කිරීමට නොපෙළඹේ. පොල් වගා රක්ෂණය රජයේ ආධාර මත පොල් වගා කිරීමේ මණ්ඩලය යටතේ සිදු කරන නැවත වගාවන් ඉලක්ක කර සිදු කරන අතර, මෙම වසරේදී එවැනි වගාවන් සිදු නොවුණි. පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් පොල් නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය යටතේ සිදු කරන වගාවන් අවු. 04 ක් යන තෙක් රක්ෂණය කිරීමේ පදනම මත මෙම රක්ෂණය ක්‍රියාත්මක වූ අතර, මෙම වසරේ එවැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සීමාවූ බැවින්, අදාල ඉලක්ක ලඟාකරගත නොහැකි විය.

උක් වගා රක්ෂණය කිරීම සඳහා හිඟුරාන සහ පැලවත්ත උක් ව්‍යාපාර සම්බන්ධ කර ගෙන සැලසුම් සකස් කරන ලදි. හිගුරාන උක් සමාගම සමඟ මේ පිළිබඳ සාකච්ඡා කිරීමේදී රක්ෂණ වාර මුදල් සම්බන්ධව එම ආයතනයේ පාලක පක්ෂයෙන් ඉදිරිපත් කල යෝජනාව සලකා බැලීමේදී මණ්ඩලයේ වර්තමාන තත්ත්වය මත එවැනි සංශෝධනයන් කර වාර මුදල් අඩු කිරීමේ හැකියාවක් මණ්ඩලය සතු නොවුණි. මේ වන විට තරඟකාරි ආයතනයක් ලෙස සණස සම්බන්ධ වී ඔවුන් අප මණ්ඩලයට වඩා අඩු වාර මුදලක් යටතේ රක්ෂණ කිරීමට එකඟතාවය පල කර ඇත. ඒ අනුව අප ආයතනයට එම වගාවන් රක්ෂණ කිරීමේ අවස්ථාව නොලැබුණි.

පැලවත්ත සමාගම සමඟ සාකච්ඡා කර රක්ෂණය කිරීමට තීරණය කර තිබුණද, ආයතනයේ තිබූ පරිපාලන ගැටළු මත එම සමාගම රජයට පවරා ගන්නා ලදි. ඒ අනුව ආයතනයේ පැවති පරිපාලන ගැටළු හා වැටුප් ප්‍රශ්ණ පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කල අතර, රක්ෂණය කෙරෙහි අවධානය යොමු නොකරන ලදි. ඒ අනුව උක් වගා රක්ෂණ ඉලක්ක ලඟා කර ගැනීමට අප මණ්ඩලයට නොහැකි විය.

ගබඩා රක්ෂණය රාජ්‍ය වී ගබඩා රක්ෂණය කිරීමේ පදනම මත සැලසුම් කරන ලදි. රජය වී මිලදී ගෙන ඒවා ගබඩා කිරීමේදී එම ගබඩා රක්ෂණය කිරීමට සැලසුම් කලත්, ඒ වන විට රජයේ වී ගබඩා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය මගින් රක්ෂණය කිරීමට වී අලෙවි මණ්ඩලය මගින් කටයුතු කර තිබීම නිසා එම ඉලක්ක සපුරා ගැනීමටද අදාල දිස්ත්‍රික් කාර්යාලයන් අපොහොසත් විය.

## 4.2 ප්‍රමාද ව්‍යාපෘති

1973 වර්ෂයේ ආරම්භ කරන ලද කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට මේ වන තෙක් ප්‍රධාන කාර්යාලයක් නොමැත. ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩමක් වෙන් කර දෙන ලෙස ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් කල ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස රජමල්වත්ත පාර,බත්තරමුල්ලේ පිහිටි භූමියකින් හෙක්ටයාර් 0.502 න් යුත් ඉඩම් කොටසක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට පවරා දෙන ලදී. එම භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මූලික සභ්‍යතා වාර්ථාවක් ලබා ගැනීම වෙනුවෙන් ඉඩම් ගොඩකිරීමේ අධිකාරිය වෙත මෙම රු.585,800/-ක මුදල ලබා දී ඇත. එම වාර්ථා පදනම් කොට ගෙන ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ව්‍යාපෘති වාර්ථාවක් පිළියෙල කර ඇති අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත එම වාර්තාව ඉදිරිපත් කර ඇත. 2011 වසරේ සිට මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මකව පවතින බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා දැනට මුදල් අමාත්‍යංශය හරහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම බාධාවක් ව පවතී.

දැනටද පෞද්ගලික ගොඩනැගිල්ලක කුළී පදනම මත ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යන බැවින්, ස්ථිර ගොඩනැගිල්ලකට කාර්යාලය රැගෙන යාමේ අවශ්‍යතාව තවදුරටත් පවතී. මේ නිසා බත්තරමුල්ලේ වෙන්කර ඇති ඉඩම තුළ ඉදිරියේදී අමාත්‍යාංශය හරහා මුදල් ප්‍රතිපාදන සපයා ගෙන ගොඩනැගිල්ලක් ඉදි කිරීමට බලාපොරොත්තු වේ. යම් හෙයකින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන්නේ නම් ගෙවා ඇති මුදල් ආපසු ලබා ගැනීමට ක්‍රියා කරනු ලැබේ.

## 4.3 මණ්ඩලයට පවරා නොගත් වාහන භාවිතය

51 – 2423 දරණ කැබ් රථය මණ්ඩලයට පවරා ගෙන ඇති අතර, අලුත්වැඩියාවන් සිදු කර ධාවනයේ යොදවා ගැනීමට පියවර ගෙන ඇත. ඉතිරි වාහන7 මණ්ඩලයට පවරා ගැනීම සම්බන්ධයෙන් දැනටද කටයුතු කරගෙන යනු ලැබේ.

## 4.4 කොන්ත්‍රාත් ගිවිසුම්

2012 දෙසැම්බර් මස 31 වැනි දිනට ගොඩනැගිලි කුළී ගිවිසුම අවසන් වූ අතර, මෙම ආයතනය ජාතික රක්‍ෂණ භාර අරමුදල සමඟ ඒකාබද්ධ කිරීම හෝ වෙනත් ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියකට යටත්

කිරීම සම්බන්ධව දිගින් දිගටම සාකච්ඡා පැවැත්වීම නිසා මණ්ඩලයේ ඉදිරි ක්‍රියාකාරීත්වය සම්බන්ධව ගැටළු සහගත තත්ත්වයක් පැන නැගී තිබිණ. තවද ගොඩනැගිලි හිමිකරු විසින් පැවති මිලට වඩා වැඩි මිලකට ගිවිසුමකට එළඹීමට කරන ලද යෝජනාව ඉදිරි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් තිබූ ගැටළුව මත පිළිනොගන්නා ලදී. එබැවින් සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩලයට මේ බැව් දැනුම් දී ගොඩනැගිලි හිමිකරුගේද එකඟතාව මත පැරණි මිලටම බදු කුලී ගෙවන ලදී. මධ්‍යම රජයේ අය-වැය යෝජනා අනුව නැවත මණ්ඩලයේ ස්ථාවරත්වය ඇති වූ පසු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ගොඩනැගිලි හිමිකරු කැඳවා සියළු තත්ත්වයන් පැහැදිලි කොට වැඩිකර ඉල්ලන ලද මුදල අඩු කර ඉන් පසු වසර 03ක කාලයකට ගිවිසුම අත්සන් කරන ලදී. ගිවිසුමක් නොතිබූ කාලය සඳහා අතිරේක ගෙවීමක්ද නොකරන ලදී.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

මණ්ඩලයේ පුරප්පාඩුව පැවති තනතුරු 126 ක් පිරවීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2014.05.22 දින ලැබී ඇති අතර, මේ වන විට අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත.

# 5. වගවීම සහ යහ පාලනය

## 5.1 මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදවීම්

නව ගිණුම් වාර්තා කරන ප්‍රමිතීන් අනුව මණ්ඩලයේ ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කල බැවින් ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා අමතර කාලයක් ලබා ගැනීමට සිදුවිය.

## 5.2 සංයුක්ත සැලැස්ම

2014-2016 වර්ෂ වෙනුවෙන් මණ්ඩලය මඟින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඇති අතර එම සැලැස්මට අනුව ඉදිරි වර්ෂයන් තුලදී ඉලක්ක සපුරා ගැනීමට  අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

## 5.3 අයවැය ලේඛණමය පාලනය

අයවැය ලේඛණය මණ්ඩලයේ යහ පාලනය සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇත.

## 6. පද්ධති සහ පාලනය

ගිණුම්කරන කටයුතු, ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්, වාහන භාවිතය, අය වැය ලේඛණය, මානව සම්පත් කළමනාකරණය, සංයුක්ත සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම යන පද්ධතියන්හි මනා පාලනයක් ඇති කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

විදුලි පණිවිඩ / தந்தி / Telegrams } රක්ෂණ / ரக்ஷன / Rakshana

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No. } 2012/4/5/මූ/ගො/2

ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No. } ..........

දිනය / திகதி / Date } 2014.11.14

විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

**<u>2013 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද14(2)(C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.</u>**

2013 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14(2)(C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

..........................
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

| දුරකථන / தொலைபேசி / Telephones | සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|---|
| | 011-2812571 | 011-5732397 | 011-5384000 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 011-2812572 | 011-2812574 | |
| | 011-2812573 | | |

**<u>ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.</u>**

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

**2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>**

**2.2.1 <u>යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම.</u>**

අංක 153/49 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සංශෝධනය කිරිමට කටයුතු කර ඇති අතර ස්වයං මූල්‍ය පදනමකින් පවත්වාගෙන යාහැකි නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් එමඟින් හඳුන්වාදෙන ලදි. අරමුදල් ශූන්‍ය වීම නිසා ගෙවීම් නවතා තිබූ ගොවි විශ්‍රාම වැටුප ද මේවන විට අඛණ්ඩව ගෙවීමට කටයුතු කරමින් පවතින අතර, 2014 අයවැය මඟින් යෝජනා කරන ලද රු.මි 1000 ක භාණ්ඩාගාර බැඳුම්කරය ද අරමුදල ශක්තිමත් කිරිම සඳහා ලබාදී ඇත. තවද 2015 අයවැය මඟින් රු.මි 2276 ක මුදලක් කෘෂිරක්ෂණ මණ්ඩලය වෙත වෙන්කර ඇති අතර, 2016,2017 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.මි 2160 ක් හා රු.මි 2200 ක් ලබාදීමට පුරෝකථනය කර ඇත. එබැවින් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළුවක් ඉදිරියේ දි ඇති නොවේ.

**2.2.2 <u>ගිණුම්කරන ප්‍රමිති හා නොඑකඟතාවන්</u>**

**(අ)** මණ්ඩලයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂික සඳහා අවශ්‍ය වෙන්කිරිම් මූල්‍ය වාර්තාවල පෙන්නුම් කර ඇත. ඔවුන්ගේ සත්‍ය වැටුප පදනම් කරගෙන අනාගත වගකීම සඳහා වෙන්කිරිම් සිදුකොට ඇත. එම වගකීම් පිළිබඳව ආයුගණක තක්සේරුවක් ඉදිරියේදි ලබාදීමට කටයුතු සිදුකරනු ලැබේ. එම අයෝජන මණ්ඩලයේ ආයෝජන තුලම ඇතුලත්ය.

**2.2.3 <u>ගිණුකරණ ප්‍රතිපත්ති</u>**

**(අ)** සේවය නවතා ඇති සේවකයන්ට අදාළ පාරිතෝෂික වෙන් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

**(ආ)** තොග ගණනයේ දි ගණන් නොගත් මඟහැරි තිබූ F.S.B. 3 වාර්තා පොත් තොගයට ඇතුලත් කිරිමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

**(ඇ) හා (ඈ)**

වර්තමානයේ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ඇතිවූ තත්වය මත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අනුව විශ්‍රාම වැටුප් වගකීම නැවත තක්සේරු කිරීමට අපේක්ෂිතය.

**(ඉ)** අදාල මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

**2.2.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.</u>**

**(අ)** සියළු ආයතන වලට ශේෂ තහවුරු ලබාදෙන ලෙස දන්වා ඇත. එයින් 51.7 % ක් තහවුරු ලිපි එවා ඇත.

**(ආ)** විගණන ගාස්තු ක්‍රමිකව ගෙවීමට පියවර ගෙන ඇත.

**(ඇ)** ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වු අවස්ථාවේ දි එයට විසදුම් සෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ පැවැති සාකච්ඡාවේදි මණ්ඩලයේ අනෙකුත් අරමුදල් මඟින් ගොවි විශ්‍රාම වැටුප් ගෙවන ලෙස තීරණය කර ලබාදුන් උපදෙස් පරිදි ධීවර විශ්‍රම වැටුප් යෝජනා ක්‍රමයෙන් හා කෘෂිරක්ෂණ අරමුදලින් මෙම අරමුදල් ලබාගෙන ඇති අතර, මේ වන විට එම ණය මුදල් පියවීමට කටයුතු සිදුකරනු ලැබේ.

**(ඈ)** අදාල මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

**3. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

**3.2 <u>මූල්‍ය තත්වය පිලිබඳ විග්‍රහත්මක සමාලෝචනය</u>**

**(i)** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රවර්ධනය නොකිරිම නිසා 2007 සිට 2012 දක්වා ආදායම අඩුවී ඇති අතර, වසය අවු 60 සම්පුර්ණ කිරිම නිසා විශාල පිරිසක් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලැබීම නිසාත් තවත් කොටසක් යෝජනා ක්‍රමයෙන් ඉවත් වීම නිසා වියදම ක්‍රමිකව වැඩිවී ඇත.

**(ii)** ගිණුම්කරණ ප්‍රමිත අනුව මුල්‍ය ප්‍රකාශන වල නිවැරදි හෙලිදරව් කිරිම් සිදුකරන ලද අතරඒ අනුව විශ්‍රාම වැටුප් වගකීම මුල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇත.වාර්ෂිකවගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම වැඩිවීමනිසා ඌනතාවයදක්‍රමිකව වැඩි වී ඇත.

**4 <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**4.1 <u>කාර්යසාධනය</u>**

**(අ)** 2010 අගෝස්තු මාසයේ සිට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වීමෙන් පසු තව දුරටත් යෝජනා ක්‍රමයට දායක කිරිමෙන් යෝජනා ක්‍රමයේ වගකීම් ප්‍රමාණය වැඩිවීම තුල මුල්‍ය අර්බුදය තවදුරටත් වර්ධනය වන බැවින් 2010 අගෝස්තු මාසයේ සිට යෝජනා ක්‍රමයට ගොවීන් දායක කරවීම අත්හිටුවන ලදි.

ඒ අනුව මෙම යෝජනා ක්‍රමයේ ක්‍රියාත්මකභාවය සම්බන්ධයෙන් ස්ථිර විසඳුමකට එළඹෙන තෙක් 2013 වර්ෂයේදීද කිසිදු දායක කර ගැනීමක් නොකල බැවින් දායක වාරික අඩු වී ඇත. වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා දායකයන් විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් ලැබීම නිසා විශ්‍රාම වැටුප වැඩි වී ඇත.

**(ආ)** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයින් බඳවා ගැනීම අත්හිටුවීම නිසා පසුවාරික අයවීම පහත වැටී ඇත.

**(ඇ)** මූල්‍ය ශක්‍යතාවයකින් යුතු නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සැකසෙමින් පැවතෙන බැවින් පැරණි යෝජනා ක්‍රමය යටතේ බඳවා ගැනීම් සිදු නොකරන ලදී.

**(ඈ)** පනත අනුවයෝජනා ක්‍රමයෙන් ඉවත් වන දායකයන් සඳහා ගෙවීම් සිදු කර ඇත. ඔවුන් ගෙවූ වාරික හා පොලිය ගෙවීම සිදුකර ඇත.

**(ඉ)** යෝජනා ක්‍රමය සතු ආයෝජන විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යොදා ගැනීම නිසා මණ්ඩලයේ ආයෝජන හා ආයෝජන ආදායම ක්‍රමිකව අඩුවී ඇත.

**4.3** <u>බැංකු ගිණුම්ක්‍රියාවලියේ අඩුපාඩු</u>

**(අ)** වසර 20 කට වඩා පැරණි මෙම උපලබ්දි නොවූ චෙක්පත් ගිණුම් වලින් ලියා හැරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

**4.4** <u>ප්‍රමාද ව්‍යාපෘති</u>

**(අ) , (ආ)**

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 26 ක් ක්‍රියාත්මක වේ.වර්තමානය වන විට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකයින් 950,000 /- ක් දායක වී ඇත.වසර 22 ක් පුරා පරිගණක ගත කිරීමේ කාර්යය සිදු කර ගෙන යාමේදී විවිධ අවස්ථා වල පැවති තාක්ෂණික පිරිවිතරයන්ට අනුව පරිගණක යන්ත්‍ර හා මෘදුකාංග මිලදී ගෙන අවශ්‍යතාවය අනුව යොදවා ගනු ලැබුවද ධාරිතාවය වැඩිවීම හේතුවෙන් හා අවශ්‍යතා මට්ටම වෙනස් වීම හේතුවෙන් නව තාක්ෂණයට ගැලපෙන අයුරින් තොරතුරු යාවත්කාලින කර ගැනීමේ අවශ්‍යතාවය ඇතිවූ නිසා මෙම වියදම දැරීමට සිදුවී ඇත. වර්තමානය වන විට කොළඹ විශ්ව විද්‍යාලය සමග එක්වී වැඩි ධාරිතාවයකින් යුතු පරිගණක පද්ධතියක් ස්ථාපනය කොට ධාරිතාවයට සරිලන මෘදුකාංග ද නිර්මාණය කර ඇත.එම පරිගණක මෘදුකාංග පද්ධතියෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය දත්තයන් පද්ධතියට ඇතුලත් කරමින් පවතින අතර දායකත්වය පිළිබඳ සියලුම තොරතුරු ලබාගත හැකි තත්වයට අවසන් කර ඇත.වසර 22 ක් පුරා ක්‍රියාත්මක වූ යෝජනා ක්‍රමයේ 950,000 ට අධික දායකයින් බැඳී ඇති අවස්ථාවක වසරකට දෙවරක් බැගින් වාරික මුදල ගෙවනු ලැබ් ඇති විට පසු වාරික මිලියන ගණනාවක් පරිගණක ගත කිරීමේ ගැටලුව පමණක් පැන නැගී ඇත.

**4.5 මතභේදයට තුඩු දෙන කරුණු**

**(අ)** මාවිල් ආරු සිදුවීමෙන් හානි සිදු වූ ගොවීන්ට වන්දි ගෙවීමේදී සිදු වී ඇති මෙම ගැටලුකාරී සිදුවීම් සම්බන්ධයෙන්ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

**(ආ)** මෙම වාර මුදල් වංචාවට සම්බන්ධ ක්ෂේත්‍ර නිළධාරි සුසිල් ප්‍රේමරත්නමහතා වැඩ තහනම්ව සිටි අතර ඔහුට විරුද්ධව HC/5/2009 අංක දරණ නඩුව අනුරාධපුර මහාධිකරණයේ විභාගයට ගැනේ.ඔහු රු.100,000/- ක මුදලක් පමණක් මණ්ඩලයට ගෙවා තිබියදි මියගොස් ඇත.මේ හේතුව නිසා ඔහුට විරුද්ධව තවදුරටත් නීතිමය වශයෙන් කටයුතු කල නොහැකි බැවින් අදාල නඩු වාර්ථා ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරන බව දන්වමි.

**5. වගවීම සහ යහ පාලනය**

**5.1 මුල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදවීම.**

නව ගිණුම් වාර්තා කරන ප්‍රමිතීන් අනුව මණ්ඩලයේ ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කල බැවින් ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා අමතර කාලයක් ලබා ගැනීමට සිදුවිය.

**5.2 සංයුක්ත සැලැස්ම**

2010 අගෝස්තු මාසයේ සිට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වීමෙන් පසු තව දුරටත් යෝජනා ක්‍රමයට දායක කිරිමෙන් යෝජනා ක්‍රමයේ වගකීම් ප්‍රමාණය වැඩිවීම තුල මුල්‍ය අර්බුදය තවදුරටත් වර්ධනය වන බැවින් 2010 අගෝස්තු මාසයේ සිට යෝජනා ක්‍රමයට ගොවීන් දායක කරවීම අත්හිටුවන ලදි.

ඒ අනුව මෙම යෝජනා ක්‍රමයේ ක්‍රියාත්මකභාවය සම්බන්ධයෙන් ස්ථිර විසඳුමකට එලඹෙන තෙක් 2013 වර්ෂයේදිද කිසිදු දායක කර ගැනීමක් නොකල අතර එබැවින් මේ සම්බන්ධයෙන් ක්‍රියාකාරි සැලැස්මක්ද සකස් නොකරන ලදි.

**5.3 අයවැය ලේඛණමය පාලනය**

යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට ලක් කරමින් තිබූ නිසා අයවැය මඟින් බලාපොරොත්තු වූ ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වී ඇත.

**6. පද්ධති සහ පාලනය**

ගිණුම්කරණය, දායක ගිණුම් පාලනය,විශ්‍රාම වැටුප් ගෙවීම, අයවැය, ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යන පද්ධතියන්හි මනා පාලනයක් ඇති කිරිමට අවශ්‍ය කටයුතු කිරිමට අපේක්ෂිතය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
கமத்தொழில் மற்றும் கமநலக் காப்புறுதிச் சபை
**AGRICULTURAL AND AGRARIAN INSURANCE BOARD**

විදුලි පණිවිඩ / தந்தி / Telegrams: රක්ෂණ / ரக்ஷன / Rakshana

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ
117, Subadrarama Rd., Gangodavila, Nugegoda

මගේ අංකය / எமது இலக்கம் / My Ref. No.: 2013/4/5/ශු / ධී /2
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. No.:
දිනය / திகதி / Date: 2014.11.03

විගණන අධිකාරී,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ.

<u>2013 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14 (2)(C) වාර්තාව සඳහා පිළිතුරු සැපයීම.</u>

2013 වර්ෂයේ ධීවර විශ්‍රාම/වැටුප් යෝජනා යෝජනා ක්‍රමයට අදාලව ඉදිරිපත් කරන ලද 14(2)(C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

.......................
අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

දුරකථන / தொலைபேசி / Telephones
ෆැක්ස් / பெக்ஸ் / Fax

| සභාපති / தலைவர் | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන කාර්යාලය / தலைமையகம் |
|---|---|---|
| 011-2812571 | 011-5732397 | 011-5384000 |
| 011-2812572 | 011-2812574 | |
| 011-2812573 | | |

**ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (C) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්ථාව සඳහා පිළිතුරු**

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 විගණන මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම**

**2.2.2 ගිණුම්කරණ ප්‍රමිති හා නොඑකඟතාවයන්**

මණ්ඩලයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිත සඳහා අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය වාර්තාවල පෙන්නුම් කර ඇත. ඔවුන්ගේ සත්‍ය වැටුප පදනම් කර ගෙන අනාගත වගකීම් සඳහා වෙන් කිරීම් සිදු කොට ඇත. එම වගකීම් පිළිබඳව ආයුගණක තක්සේරුවක් ඉදිරියේදී ලබා දීමට කටයුතු සිදු කරනු ලැබේ. එම ආයෝජන මණ්ඩලයේ ආයෝජන තුලම ඇතුලත්ය.

2007 වර්ෂයේදී ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ වගකීම පිලිබඳ ආයු ගණක තක්සේරුවක් සිදු කර ඇති අතර එය පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර ඇත. ඉදිරියේදී ආයු ගණක තක්සේරුකරුවකු ලවා නැවතත් වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වාර්ෂිකව රු. 1,500,000 මුදලක් ධීවර අමාත්‍යාංශයෙන් ලබා දුන්න ද එම මුදල අනිවාර්යෙන්ම මණ්ඩලය වෙත ලබා දිය යුතු බවට කිසිදු ගිවිසුමක් මණ්ඩලය හා ධීවර අමාත්‍යාංශය අතර නොමැත. කෙසේ නමුත් 2013 වර්ෂයේ දී ධීවර ආමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට රු. 1,500,000 ක මුදලක් ලබා ගැනිමට කටයුතු කල අතර 2014 වර්ෂය වෙනුවෙන් ද පරිපාලන වියදම් ලබා ගැනිමට කටයුතු කරන ලදී.

**2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**(අ)** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල ඇති වූ මූල්‍ය අර්බුදය පිළිබඳව මහා භාණ්ඩාගාරයේ පැවති සාකච්ඡාවේදී තීරණය වූ පරිදි ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත මෙම මුදල් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙත ලබා දී ඇත. මෙම ණය මුදල ක්‍රමිකව පියවීමට අපේක්ෂිතය.

**(ආ)** විගණන ගාස්තු ඉදිරියේදී ක්‍රමිකව පියවීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.5 <u>පොලි ආදායම හඳුනා ගැනීම</u>

ධීවර විශ්‍රාම වැටුප් අරමුදල් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා යෙදූ මුදල එම යෝජනා ක්‍රමයට ලබා දුන් ණය මුදලක් ලෙස සලකා කටයුතු කළ බැවින් එම පොළී ගැලපීම් සිදු කර ඇත. ඉදිරියේදී මෙම ණය හා පොලි ක්‍රමිකව පියවීමට කටයුතු කරනු ලැබේ.

## 2.3 <u>නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම</u>

**(අ) (i)** ධීවර උපදේශක කාරක සභා සාමාජිකයින්ගේ නිළ කාලය අවසන් වීමෙන් පසු ඒ සඳහා නැවත සාමාජිකයින් පත්කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම් මගින් අදාල ආයතන වෙත දැනුම් දී ඇත.එසේ උපදේශක කාරක සභාවට සාමාජිකයින් පත් නොකල ආයතන වෙත ඒ පිලිබඳව දැනුම් දීමට පියවර ගෙන ඇත.

**(ii)** අඛණ්ඩව වාරික 5 ක් ගෙවීම සිදු නොකලහොත් ධීවරයන්ගේ දායකත්වය අහෝසි වන බව යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී පූර්ව දැනුම් දීමක් සිදු කර ඇත.අවලංගු වූ දායකයන් සඳහා ඔවුන්ගේ වයස 60 සම්පූර්ණ වූ පසු ඔවුන් මණ්ඩලය වෙත ගෙවන ලද මුදල් හා පොලිය ආපසු ගෙවනු ලබන අතර ධීවර දෙපාර්තුමේන්තුවේ සහකාර දිස්ත්‍රික් කාර්යාල මගින් එසේ යොමු කරන ලද අවලංගු වූ දායකයන් හට මේ වසර තුලදිද මුදල් හා පොලි ආපසු ගෙවීම් සිදු කර ඇත.

**(ආ)** කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතට අනුව සේවය කරන මණ්ඩලීය නිළධාරීන් වෙත ධීවර අමාත්‍යාංශයට අයත් ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අතිරේක වැඩ කොටසක් පැවරී ඇත. ඒ අනුව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ මෙම මණ්ඩලීය කාර්යභාරය වෙනුවෙන් වෙනමම කාර්යමණ්ඩලයක් අනුමත නොවීම හේ: ෟමෙම වැඩ ආවරණය කිරීම වෙනුවෙන් මෙම දීමනා ගෙවනු ලැබේ. එය 1991 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප ආරම්භ කල දිනයේ සිට ගෙවා ඇත.

මෙම ගෙවීම් සඳහා පහත සඳහන් අනුමැතීන් ලැබී ඇත.

- ධීවර විශ්‍රාම වැටුප් උපදේශන කාරක සභා අනුමැතිය.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය.
- විෂය භාර අමාත්‍ය රාජ්‍ය ලේකම්ගේ අනුමැතිය.

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

3.2 <u>මූල්‍ය තත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය</u>

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්යසාධනය</u>

**(අ),(ආ),(ඇ),(ඈ),(ඉ)**

මෙම යෝජනා ක්‍රමය ධීවර අමාත්‍යාංශය හා ධීවර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ක්‍රියාත්මක කරන අතර කෘෂිරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වන්නේ යෝජනාක්‍රමය පරිපාලනය හා ගිණුම් තබා ගැනීම වේ. කාර්යසාධනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ධීවර දෙපාරේතමේන්තුව විසිනි.

4.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

යෝජනා ක්‍රමයේ අවලංගුවූ දායකයින් පිළිබඳ තොරතුරු ධීවර අමාත්‍යාංශය වෙත යොමු කොට ඇති අතර ඔවුන්ගේ හිඟ වාරික අය කිරීම හා දායකත්වයේ රඳවා තැබීම සම්බන්ධයෙන්ද ධීවර අමාත්‍යාංශය සමග ඒකාබද්ධව ඉදිරියේදි කටයුතු කිරිමට අවශ්‍ය පියවර ගෙන ඇත.

5. <u>වගවීම සහ යහ පාලනය</u>

5.1 <u>මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදවීම්.</u>

නව ගිණුම් වාර්තා කරන ප්‍රමිතීන් අනුව මණ්ඩලයේ ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කල බැවින් ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා අමතර කාලයක් ලබා ගැනීමට සිදු විය.

6. <u>පද්ධති සහ පාලනය</u>

යෝජනා ක්‍රමයේ අරමුණු ඉටු කර ගැනිම, ධීවරයින් සඳහා ප්‍රතිලාභ ලබා දීම, ලැබිය යුතු මුදල්, පසු වාරික මුදල් අය කර ගැනිම, උපදේශක කාරක සභා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරිම යන කරුනු කෙරෙහි මේ වන විට දැඩි අවධානය යොමු කර ඇති අතර ඉදිරියේදි තවදුරටත් විශේෂ අවධානය යොමු කිරිමට අපේක්ෂිතය.